ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

වාර්ෂික වාර්තාව

2015

අන්තර්ගතය	i
තපරවදන	ii
සංඥාපනය	iii
ඉතිහාසය	iv
හැඳින්වීම	v
දැක්ම හා මෙහෙවර	vii
2015.....	viii
1. ආයතනික තොරතුරු	1
2. පාලක මණ්ඩලය	3
3. පරිපාලන ව්‍යුහය	10
4. අධිකාරියේ අරමුණු	11
5. අධිකාරියේ ප්‍රධාන කාර්යයන්	11
6.පුහුණු ක්‍රමවේදය සහ අනෙකුත් ප්‍රධාන වැඩසටහන්	12
7. දත්ත නිරූපණය සහ විශ්ලේෂණය	18
8. අනෙකුත් ක්‍රියාකාරකම්	53
9. විගණන වාර්තාව හා පිළිතුරු	68

පෙරවදන

1971 අංක 49 දරණ ජාතික ආධුනිකත්ව ජාතික පනත යටතේ ආධුනිකත්ව මණ්ඩලය ලෙස ආරම්භ කරන ලදුව 1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය ලෙස තව දුරටත් තම වගකීම් සහ කාර්යභාරයන් පුළුල් කරමින් වසර 44ක් පුරා තම අනන්‍යතාවය සනිටුහන් කරමින් අප ආයතනය වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය තුළ තව දුරටත් දැවැන්ත කාර්යභාරයක් ඉටුකරමින් සිටී.

තම හැකියාවන් හා වැඩ පරිසරය සුසංයෝග කොටගෙන "වැඩබිමට නයිට් වරයෙක් " යන තේමාව යටතේ වැඩ බිම තුළ පුහුණුව ලබන ආධුනිකයා ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ අනන්‍යතාවය වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය තුළ ස්ථාවර කිරීමට දායක වේ.

එමෙන්ම වසරක් පාසා ඉලක්ක හා අරමුණු ලඟාකරගනිමින්, අප සතු දැනුමෙන් හා අත්දැකීම් වලින් තරුණ තරුණියන් හට ඔවුන්ගේ වෘත්තීය අධ්‍යාපන කටයුතු විධිමත් ලෙස හැදෑරීමට අවස්ථාව සලසා දී ඇත.

ඒ තුළින් රටේ ආර්ථිකයට අවශ්‍ය නිපුණතාවයෙන් හෙබි තරුණ පරපුරක් බිහිකිරීමට හැකිවීම තුළින් රටේ ජාතික ආදායමට දායකත්වය ලබාදීමට හැකි වී ඇත.

මෙම වාර්ෂික වාර්තාව මඟින් අධිකාරියේ 2015 වසර තුළ ක්‍රියාත්මක වූ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය දිග හැර දක්වයි. ඉතා තරඟකාරී පරිසරයක් තුළ විවිධ දුෂ්කරතා වලට සාර්ථක ලෙස මුහුණ දෙමින් අධිකාරිය තම අරමුණු සහ කාර්යයන් මඟින් සේවා ලාභීන්ගේ අවශ්‍යතා ඉටුකරලීමට සමත් වී ඇත. මේ සියලු කර්තව්‍යයන් සිදුකිරීමේදී කාර්ය මණ්ඩලයේ නොමඳ කැපවීමත් , රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි සහයෝගයත් ලැබෙන බව අවිවාදයෙන් කිව හැකිවේ.

පාලක මණ්ඩලයේ මඟපෙන්වීම සහ නයිටා ආයතනයේ කාර්යමණ්ඩලය විසින් ඉටුකළ කාර්යභාරයට හා පුහුණුවන්නන් සඳහා පුහුණු අවස්ථා ලබාදුන් විවිධ රජයේ හා පෞද්ගලික අංශයේ ආයතනයන්ටත් ස්තූති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

ජේ. වයි. පීරිස්
සභාපති
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

සංඥාපනය

1971 අංක 38 දරණ මුදල් පනතේ 14 වන වගන්තිය අනුව අධිකාරිය විසින් වාර්ෂික වාර්තාව පිළියෙල කළ යුතුව ඇත.

මෙම වාර්තාවේ කොටස් 03ක් අඩංගු වන අතර පුහුණු වැඩසටහන් වල ප්‍රගතිය පිළිබඳ විස්තර, පුහුණුව සම්බන්ධව සංවර්ධන කටයුතු සහ වර්ෂයට අදාල සංක්ෂිප්ත වාර්ෂික ගිණුම් වාර්තාව හා විගණකාධිපති වාර්තාවෙහි ඇතුලත් තොරතුරු අන්තර්ගතකොට මෙම වාර්තාව පිළියෙල කර ඇත.

2015 වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම සඳහා දිවයින පුරා ක්‍රියාත්මක වන දිස්ත්‍රික් කාර්යාල 25හි කළමණාකරුවන් හා ජාතික ආයතන වල ආයතන ප්‍රධානීන් මෙන්ම ප්‍රධාන කාර්යාලයෙහි ඒ ඒ අංශයන්හි අංශ ප්‍රධානීන් විසින් ලබා දුන් තොරතුරු පදනම් කොට ගන්නා ලදී. එම තොරතුරු විශ්ලේෂණය කර සංක්ෂිප්තව මෙම වාර්තාව සකස් කර ඉදිරිපත් කරන ලදී.

සැලසුම් හා පසුවිපරම් අංශය

2015

ඉතිහාසය

1. මෙයට වසර 44 කට පමණ පෙර ශ්‍රී ලංකාව තුළ ඇති වූ තරුණ අසහනයට පිළියමක් ලෙස රජයේ මැදිහත් වීම මත 1971 අංක 49 දරණ ජාතික ආධුනිකත්ව පනත යටතේ ජාතික ආධුනිකත්ව මණ්ඩලය පිහිටුවන ලදී. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හා ජාත්‍යන්තර කම්කරු සහයෝගය ඇතිව ආධුනිකත්ව පුහුණුව සම්බන්ධ විෂයමාලා සංවර්ධනය, පුහුණු වැඩසටහන් සඳහා ප්‍රමිති නිර්ණය කිරීම, දුරස්ථ අධ්‍යාපනය සඳහා අදාල උපදෙස් පිළියෙල කිරීම, ජාතික ශිල්පීය සහතික ප්‍රදානය කිරීම ආදී විවිධ ජයග්‍රහණයන් ජාතික ආධුනිකත්ව මණඩලය යටතේ ළඟා කරගන්නා ලදී.
2. 1983 වසරේදී ප්‍රථම ජාතික පුහුණු ආයතනය ලෙස ආධුනිකත්ව අභ්‍යාස ආයතනය ජර්මන් ෆෙඩරල් ජනරජයේ ආධාර ඇතිව නො.581, ගාලු පාර, කටුබැද්ද, මොරටුව යන ස්ථානයේ පිහිටුවන ලදී. 1985 දී දෙවන ජාතික පුහුණු ආයතනය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ ලෝක කම්කරු සංවිධානය සමඟ ඒකාබද්ධව තාක්ෂණවේදයන් පුහුණු කිරීමේ ආයතනය නමින් 18 කණුව, පන්සල පාර, කටුනායක යන ස්ථානයේ පිහිටුවන ලදී.
3. 1989 දී තෙවන ජාතික පුහුණු ආයතනය ලෙස ජපන් රජයේ ආධාර මත මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය නො.07, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය යන ස්ථානයේ පිහිටුවන ලදී.
4. ආයතනයේ කටයුතු තවත් පුළුල් කිරීම සඳහා 1990 දී අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ ii කොටස යටතේ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය ලෙස ස්ථාපිත කරන ලදී.
5. අනතුරුව ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ පරිපාලනය පළාත් කාර්යාල ලෙස විමධ්‍යගත කරන ලද අතර තව දුරටත් දිස්ත්‍රික් කාර්යාල හා පර්ෂද කාර්යාල ලෙසට ක්‍රමයෙන් විකාශනය විය.
6. තෘතීය අධ්‍යාපන පනතට අනුව ඉංජිනේරු උපාධි ආයතනයක් සහ තෘතීය අධ්‍යාපන ආයතන මගින් පවත්වාගෙන යන උසස් ඩිප්ලෝමා සඳහා අදාල යන්ත්‍රාගාර පුහුණුව දෙනු ලැබේ.
7. හතරවන ජාතික පුහුණු ආයතනය ජර්මන් ජන රජය GIZ හා KFW ආයතන වල මූල්‍ය ආධාර මත කිලිනොච්චියේ ආරම්භ කිරීමට 2014 දෙසැම්බර් 04 දින මුල් ගල තබන ලදි.
8. 2014 සිට අනෙකුත් වෘත්තීය පුහුණු ආයතන වල ආයතනික පුහුණුව සම්පූර්ණ කරන්නන් සඳහා හය මාසයක කාර්යස්ථ පුහුණුව අධිකාරිය මගින් සපයනු ලබයි. විශේෂයෙන් කාර්මික විශ්ව විද්‍යාල, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,ජාතික තරුණ සේවා සභාව සහ අනෙකුත් පිළිගත් රජයේ / පෞද්ගලික ආයතන වල වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ පුහුණුව ලැබුවන්ට කාර්මික අංශයේ ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දීම සඳහා මෙම පුහුණුව ආරම්භ කොට ඇත.

හැඳින්වීම

නෛතික ව්‍යූහය

1971 අංක 49 දරණ ජාතික ආධුනිකත්ව ජාතික පනත යටතේ ජාතික ආධුනිකත්ව මණ්ඩලය ලෙස ආරම්භ කරන ලදුව 1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය ලෙස ස්ථාපිත විය.

තම කාර්යභාරයන් නිසි ලෙස ඉටු කරමින් අභිමානවත් 44 වසර පසු කරන අප අධිකාරියේ 1971 සිට 2015 දක්වා වෘත්තීය පුහුණු කිරීම් ක්ෂේත්‍රය තුළ පැමිණි ගමනට විශාල ශක්තියක් එක් කළ සාමාජිකයන් පිළිබඳ බිඳක් දැක්වීමට කැමැත්තෙමු.

1. <u>පුහුණු අංශය</u>

   බඳවාගැනීම් අංශය, පුහුණු කිරීම් අංශය, යන්ත්‍රාගාර පුහුණු අංශය, කාර්යස්ථ පුහුණු අංශය, වෘත්තීය මාර්ගෝපදේශන අංශය යන ප්‍රධාන අංශ වලින් සමන්විත පුහුණු අංශය දිස්ත්‍රික්ක 25 හරහා සමස්ථ ශ්‍රී ලංකාව පුරා පුහුණු කටයුතු සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ පවත්වාගෙන යාම යන අරමුණු සාක්ෂාත් කිරීමට උරදෙමින් කටයුතු කරයි.

2. <u>තත්ත්ව අංශය</u>

   විෂයමාලා සංවර්ධන අංශය, තත්ත්ව කළමනාකරණ අංශය, ජාතික වෘත්තීය පරීක්ෂණ අංශය,ජාතික වෘත්තීය සුදුසුකම් අංශය, ඇගයීම් අංශය, සහතික අංශය යන ප්‍රධාන අංශයන්ගෙන් සමන්විත තත්ත්ව අංශය පුහුණු අංශයේ පුහුණු කටයුතු වඩාත් ක්‍රමවත්ව සහ කාර්යක්ෂමව සිදු කිරීමට අවශ්‍ය සම්පත් සංවර්ධනය කරමින්, ආධුනිකයන්ගේ සහ ආයතනයේ ගුණාත්මක භාවය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මෙවලම් සම්පාදනය කරමින් අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීමට විශාල ශක්තියක් ලබාදේ.

3. <u>සැලසුම් හා පසුවිපරම් අංශය</u>

   සියලු දිස්ත්‍රික් කාර්යාල, ජාතික ආයතන, පරිපාලන, තත්ත්ව, මූල්‍ය හා පුහුණු යන සියලුම අංශයන් ආවරණය කරමින් ඔවුන්ගේ ප්‍රගතියන් දත්ත කළමනාකරණ පද්ධතිය හරහා ලබා ගනිමින්, මාසික ප්‍රගති වාර්තා, කාර්තුමය වාර්තා, වාර්ෂික වාර්තා සහ අවශ්‍යතාවය අනුව අනෙකුත් වාර්තා ජනනය කරමින් රේඛීය අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලට අවශ්‍ය පරිදි තොරතුරු ලබා දෙමින් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය බාහිර පරිසරය සමඟ සම්බන්ධීකරණය කිරීමට කටයුතු කරනු ලැබේ.
   තව ද අධිකාරියේ කටයුතු නිදි පරිදි මෙහෙය වීම සඳහා අවශ්‍ය සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ අවශ්‍යතාව අනුව විවිධ ආකාරයෙන් සැලසුම් සකස් කිරීම ප්‍රධාන වගකීම වේ.ඒ වගේම අධිකාරියේ පුහුණු හා

පුහුණු සම්බන්ධ අධීක්ෂණය කිරීම හා පසුවිපරම් කිරීමද මෙම අංශය මගින් ඉටු කරණු ලබයි. තවද පුහුණුවට සියළුම තොරතුරු සහ සේවකයන් සම්බන්ධ තොරතුරු එක්රැස් කිරීමට අදාල කළමණාකරණ තොරතුරු පද්ධතිය පිළියෙළ කිරීමේ හා පරිපාලනය කිරීමේ කටයුතු ද මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයකි.

4. පරිපාලන අංශය

නිලධාරීන් බඳවාගැනීම් අංශය, ප්‍රවාහන අංශය, ඉදිකිරීම් හා නඩත්තු අංශය, නීති අංශය, නිලධාරී පුහුණු අංශය යන ප්‍රධාන අංශ වලින් සමන්විත අතර, මානව සම්පත් හා අනෙකුත් භෞතික සම්පත් කාර්යක්ෂම ලෙස පාලනය හා උපයෝජනය කරමින් ආයතනයේ ඉදිරි ගමනට දැවැන්ත ශක්තියක් ලබාදේ.

5. මූල්‍ය අංශය

ප්‍රසම්පාදන අංශය, ගබඩා අංශය, ගෙවීම් අංශය, වැටුප් අංශය සහ පොත් තැබීම් අංශය යන ප්‍රධාන අංශ වලින් සමන්විත වන අතර වාර්ෂිකව සැලසුම් අංශය මගින් පිළියෙන කරනු ලබන ක්‍රියාකාරී හා සංයුක්ත සැලසුම් අනුව පිළියෙල කරනු ලබන වාර්ෂික අයවැය ලේඛනය නිසි අයුරින් මෙහෙයමින් ආයතනයෙහි සියලු කටයුතු සඳහා සජීවී බවක් එක් කිරීමට ප්‍රධාන දායකත්වය ලබාදේ.

6. විගණන අංශය

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ අභ්‍යන්තර විගණන කටයුතු මෙහෙයවමින් විගණකාධිපති දෙපාර්තමේන්තුව, රේඛීය අමාත්‍යංශය ඇතුලු අනෙකුත් ආයතන සමඟ සම්බන්ධ වෙමින් කටයුතු කරයි. අභ්‍යන්තර පාලනය සහ ආයතනයේ කටයුතු වල විනිවිද භාවය විධිමත් ලෙස පවත්වාගෙන යාම සඳහා විගණන හා කළමනාකරණ කමිටු සම්බන්ධීකරණය සහ කළමනාකාරීත්වයට අවශ්‍ය තොරතුරු ලබා දෙමින් විශාල මෙහෙයක් ඉටු කරනු ලැබේ.

දැක්ම

කර්මාන්ත ක්ෂේත්‍රයේ අවශ්‍යතාවන්ට උචිත පරිදි තරුණ හැකියා සංවර්ධනය කරන විශිෂ්ට ආයතනය බවට පත් වීම.

මෙහෙවර

කර්මානතයෙහි කැපවූ හා විනයානුකූල මිනිස් බලයේ අවශ්‍යතාවයට මුහුණු දීම සඳහා නිපුණතා පුහුණු වැඩසටහන් තුළින් වෘත්තීය ප්‍රවීණතාව නිමිත්තෙන් තරුණයන්ට කර්මාන්ත පාදක කරගත් වෘත්තීය හා කාර්මික පුහුණුව සැපයීමට,

- වඩාත් ගැලපෙන හා යෝග්‍ය තරුණයන් ආකර්ශනය කර ගැනීම.
- ඉතා ඉහළ අභිප්‍රේරණයක් හා ව්‍යුහයකින් යුත් වෘත්තීය ආයතනයක් වීම.
- කැපවීමෙන් යුත් දායකයන් හා පුහුණු සපයන්නන්ගෙන් කැපවූ සහයෝගිතාව ලබා ගැනීම.
- හැකියා පාදක කරගත් ආර්ථිකයක් ගොඩනැංවීමේ ජාතික අරමුණ ළඟාකර ගැනීමට දායකත්වය ලබාදීම.

2015.....

2015 වසර තුළදී ඉලක්ක ජය ගනිමින් ආධුනිකයින් 41,192 ක් සියළුම ක්‍රමවේදයන් මගින් බඳවා ගත් අතර, පුහුණුව නිම කළ ආධුනිකයින් 24,054 ක් නිපුණ ශිල්පීන් ලෙස සමාජ ගත කරන ලදී.

විවිධ වෘත්තීන් යටතේ ආධුනිකයින් 21,834 දෙනෙකුට සහතික පත් නිකුත් කර ඇති අතර 2015 වර්ෂයේදී ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික 11,466 ක් නිකුත් කිරීම.

කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව	15,434
මධ්‍යස්ථාන පාදක ද්විත්ව පුහුණුව	5,255
ජාතික ආයතන	1,173
අර්ධකාලීන පාඨමාලා	1,016
රැකියාස්ථ පුහුණුව (වෙනත් පුහුණු ආයතන)	10,040
විශේෂ කර්මාණ්ත පුහුණුව	8,274

01.ආයතනික තොරතුරු



ප්‍රධාන කාර්යාලය
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.
දූ.ක. 011-2888782 - 7

ඉංජිනේරු තාක්ෂණික ආයතනය
18 කණුව, පන්සල පාර,
කටුනායක.
දූ.ක. 011-2252833

කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය
නො. 581, ගාලුපාර, කටුබැද්ද,
මොරටුව.
දූ.ක. 011-2647393, 011-2643847

මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය
නො. 07, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා
මාවත, ඔරුගොඩවත්ත.
දූ.ක. 011-2572977

අම්පාර දිස්ත්‍රික් කාර්යාලය
නො. 06, ජී. එස්. පටුමග,
කල්මුණායිකුඩි 13, කල්මුණේ.
දූ.ක. 067-2229357

අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය
ගුවන් තොටුපල මාවත, අනුරාධපුරය.
දූ.ක. 025-2223178

බදුල්ල දිස්ත්‍රික් කාර්යාලය
4/10, මල්වත්ත පාර, බදුලුපිටිය, බදුල්ල.
දූ.ක. 055-2230644

මඩකලපුව දිස්ත්‍රික් කාර්යාලය
නො.16/1, නව කල්මුණේ පාර,
මඩකලපුව.
දූ.ක. 065-2228130

කොළඹ දිස්ත්‍රික් කාර්යාලය
නො. 242, හැව්ලොක් ටවුම,
කොළඹ 05.
දූ.ක. 011-2587258, 011-2597671

ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය
නො. 393, වක්වැල්ල පාර, ජූල්ගහ,
ගාල්ල.
දූ.ක. 091-2235628

ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
නො.61/5, මිනුවන්ගොඩ පාර,
ගම්පහ.
දූ.ක. 033-2232874

හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය
නො.39, පල්ලික්කුඩාව පාර, තංගල්ල.
දූ.ක. 047-2241512

යාපනය දිස්ත්‍රික් කාර්යාලය
නො. 44, සෝමසුන්දරම් ඇවිනිව්,
වුන්දිකුලි, යාපනය.
දූ.ක. 021-2222383

කළුතර දිස්ත්‍රික් කාර්යාලය
326/2, 3 වන මහල, කෙළින්
වීදිය,ගාලුපාර, කළුතර දකුණ.
දූ.ක. 034-2224239

මහනුවර දිස්ත්‍රික් කාර්යාලය
108/2/බී, තිවංක බෝධි මාවත,
මහනුවර.
දූ.ක. 081-2201918

කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය
නො. 440, නුවර පාර, මීපිටිය,
කෑගල්ල.
දූ.ක. 035-2223127

කිලිනොච්චි දිස්ත්‍රික් කාර්යාලය
නුවර පාර,අනදපුරම්, කිලිනොච්චිය.
දූ.ක. 0343942824

කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය
මීගමුව පාර, මල්කඩුවාව, කුරුණෑගල.
දූ.ක. 037-2223789

මාතර දිස්ත්‍රික් කාර්යාලය
නො. 27 ඒ, විවෘත විශ්ව විද්‍යාල පාර,
නුපේ, මාතර.
දූ.ක. 041-2226958

මන්නාරම දිස්ත්‍රික් කාර්යාලය
952/1, නල්ලයාර් වීදිය, පරණ මූර් වීදිය,
මන්නාරම.
දූ.ක. 023-2223404

මාතලේ දිස්ත්‍රික් කාර්යාලය
නො.11, පන්සල පාර, මණ්ඩන්ඩාවල,
මාතලේ.
දූ.ක. 066-2223173

මොණරාගල දිස්ත්‍රික් කාර්යාලය
උසාවි සංකීර්ණය, මොණරාගල.
දූ.ක. 055-2276504

මුලතිව් දිස්ත්‍රික් කාර්යාලය
මාන්කුලම් පාර,මුල්ලියාවෙලෙ,
මුලතිව්.
දූ.ක. 021-2061012

නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය
නො. 116, කෝවිල් පාර, හාවාඑළිය,
නුවරඑළිය.
දූ.ක. 052-2223702

පොලොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය
නො. 103, වාරිමාර්ග පෙදෙස,
නවනගරය, පොළොන්නරුව.
දූ.ක. 027-3223023

පුත්තලම දිස්ත්‍රික් කාර්යාලය
මෝලවත්ත, මැදගම පාර,
මාදම්පේ.
දූ.ක. 032-2248250

රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය
නො. 642, විද්‍යාල මාවත, නව නගරය,
රත්නපුර.
දූ.ක. 045-2228667

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කාර්යාලය
නො.103/7, තැපැල් කාර්යාලය පාර,
ත්‍රිකුණාමලය.
දූ.ක. 026-2226569

වවුනියාව දිස්ත්‍රික් කාර්යාලය
ඕෆ් පාර්ක් පාර, වවුනියාව.
දූ.ක. 024-2224679

02. පාලක මණ්ඩලය

09/11/2015 දෙසැම්බර් සිට

01. ජේ. වයි. පීරිස් මයා
සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

02. ආචාර්ය ඒ. යු. සී. අතුකෝරාල මයා
උප සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

03. ජේ. එම්. සී. එම්. ජයවර්ධන මැනිකේ මිය
අධ්‍යක්ෂ ජනරාල්,
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම,
354/2, ඇල්විටිගල මාවත,
කොළඹ -05.

04. කිංස්ලි ශ්‍රී දොඩන්ගොඩ මයා
ස්වාධීන රූපවාහිනී,
ටොරින්ටන් චතුරස්‍රය,
කොළඹ - 07.

05. නලින් මැදගෙදර මයා
නීතීඥ,
පාලන අංශය,
LECO ඉඩම,
මොරටුව.

06. ආරියදාස කරුණානායක මයා
නො 27, නාමල්ගම,
නාගොඩ.

07. ප්‍රසන්න ප්‍රනාන්දු මයා
53, පී. බී. අල්විස් පෙරේරා මාවත
කටුබැද්ද.
මොරටුව.

08. එල්.ඒ. පන්ඩිතරත්න මහත්මිය
27/5, දියපාරුල්ල,
ගෝවින්න.

09. චාර්ල්ස්.ඊ.කොරයා මයා
92 පුත්තලම් පාර,
පුත්තලම.

10. පී. දොන් චන්ද්‍රලාල් ප්‍රේමරත්න මයා
නො 173, පෙට්‍රිස් වත්ත
යටදොලවත්ත,
මතුගම.

11. ශානක පෙරේරා මයා
40 ඒ, විජේරාම මාවත,
කොළඹ - 7

12. හසිත ගුණවර්ධන මයා
358 ඒ-1,
දොඹගොඩ,
හොරණ.

13. දයා ශ්‍රී නරේන්ද්‍ර රාජපක්ෂ මයා
27, රිචර්ඩ් ද සොයිසා මාධ්‍ය ආයතනය,
කොස්වත්ත,
තලංගම,
බත්තරමුල්ල.

14. ප්‍රියන්ත කංනන්ගර මයා
2/ 2/ 4/ ට්‍රිලියම් නිවාස සංකීර්ණය,
ඇල්විටිගල මාවත,
කොළඹ - 08

22/04/2015 සිට 08/11/2015 දක්වා

01. ආචාර්ය එච්. එල්. ඔබේසේකර මයා
සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

02. පියතිස්ස ගමගේ මයා
උප සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

03. පූජ්‍ය, මීවනපැලැනෙ ධම්මරතන හිමි
ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය,
ගාලු පාර, පටුවත,
දොඩන්දූව, හික්කඩුව.

04. ජේ. එම්. සී. එම්. ජයවර්ධන මැණිකේ මිය
අධ්‍යක්ෂ ජනරාල්,
තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම,
354/2, ඇල්විටිගල මාවත,
කොළඹ -05 .

05. ආනන්ද මාපලගම මයා
ප්‍රධාන කළමණාකරු,
ඩීසල් සහ මොටර් ඉංජිනේරු ආයතනය,
තැ පෙ 331,
කොළඹ 14.

06. අජිත් ගමගේ මයා
7/1, මැදගම,
නෙළුව,
ගාල්ල.

07. පී. ඩී. හවුජේ. ලියනගේ මයා
නො 357/64,
සරසවි අසපුව,
හපුගල,
වක්වැල්ල,ගාල්ල.

08. කීර්ති ගමගේ මයා
මැදගම,
නෙළුව.

09. ආර්.නන්දිමිත්ත පී ද සොයිසා මයා
කූලේගොඩ හංදිය,
කූලේගොඩ,
අම්බලන්ගොඩ.

10. ඩබ්. පී. සුනිල් මයා
අයිතිකරු
ශිහාරා තේ කර්මාන්තායතනය,
තවලම,
ගාල්ල.

11. පී. කේ . ඩි .සුමිත් අල්විස් මයා
සුමාලි,
නො 53/6,
අළුත් ගම පාර,
ඇල්පිටිය.

12. ඩී. ඩබ්. විතාරන මයා
නීතීඥ,
නො 09, ලේන් බාන් පෙදෙස,
කොටුව,
ගාල්ල.

13. පී. අබේසුන්දර මයා
මලමුර,
මාපලගම,
ගාල්ල

14. සදුන් ප්‍රවීරාජ් ගුරුසිංහ මයා
යටලමත්ත,
ගාල්ල.

06/03/2015 සිට 21/04/2015 දක්වා

01. ආචාර්ය හද්‍රානී තෝරදෙණිය මිය
සභාපති
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

02. බණ්ඩාරතිලක මිරිහෙල්ල මයා
උප සභාපති
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

03. ජේ.එම්.සී.එම්.ජයවර්ධන මැණිකේ මිය
අධ්‍යක්ෂ ජනරාල්,
තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම,
354/2, ඇල්විටිගල මාවත,
කොළඹ -05 .

04. ඒ.එච්.එස්.ෆරීඩා මිය
ව්‍යාපෘත් කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය,
ලේකම් කාර්යාලය,
කොළඹ 01.

05. ආචාර්ය එම්.බී.ඒකනායක මයා
216, පන්සල පාර,
තලපත්පිටිය,නුගේගොඩ.

06. අසෝක ජයවර්ධන මයා
11, උද්‍යාන මාවත,
දෙහිවල.

07. කේ.ආර්.ගාමිණී ගුණසිංහ මයා
සෙන්දිරියමුල්ල,
යෝගියාන, සඳලංකාව

08. තුසිත අලුත්පටබැඳිගේ මයා
110/1, ජූල් පල්ලම,
තිස්සමහාරාමය.

09. ඩබ්.එම්.ලීලසේන මයා
59/1A, වනාත පාර,
මහරගම.

08/01/2015 දක්වා

01. චන්දන අරුණාදේව සිල්වා මයා
සභාපති
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

02. ලෙස්ලි වීරමන්ත්‍රී මයා
උප සභාපති
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

03. සී. විජේවර්ධන මිය
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

04. ආචාර්ය එස්. ඩී. ආර්. පෙරේරා මයා
අධ්‍යක්ෂ ජනරාල්
තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිසම,
345/2, ඇල්විටිගල මාවත,
කොළඹ 05.

05. ඒ. ආර්. දේශප්‍රිය මයා
අතිරේක ලේකම්
යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය
"නිපුණතා පියස"
354/2, ඇල්විටිගල මාවත,
කොළඹ 05.

06. රාජා හේවාබෝවිල මයා
සභාපති,
සිලිකන් කොටින්ස්,
69, බුත්ගමුව පාර,
රාජගිරිය.

07. නීතීඥ බුද්ධික ඉද්දමල්ගොඩ මයා
"චන්දන" මූනමල් පෙදෙස,
වීර මාවත, පන්නිපිටිය.

08. එස්. සී. වීරසේකර මයා
සමූහ අධ්‍යක්ෂක
මහරාජා සමූහ ව්‍යාපාරය,
515/7, ටී.බී.ජයා මාවත,
කොළඹ 10.

09. පී. එච්. සුනිල් ගොන්සාල් මයා
කළමණාකාර අධ්‍යක්ෂ,
නිවාසී ඩිවලපර් (පුද්.) සමාගම
49/16, ගාලුපාර,
කොළඹ 03.

10. ආචාර්ය අනුර පී. ජයසූරිය මයා
ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය,
මූලික පාංශු විද්‍යා අධ්‍යයන අංශය,
පාංශු වෛද්‍යපීඨය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය,
පේරාදෙණිය.

11. හිත්තෙටියගේ උදය මයා
සමාගම් අධ්‍යක්ෂ,
නො. 31, ඉසදින් නගරය,
මාතර.

12. එම්. උවයිස් මොහොමඩ් මයා
කළමණාකරු,
ව්‍යවසායක සම්පත් හා මූල්‍ය කළමනාකරණ ආයතනය,
8/3A, බොයිඩ් පෙදෙස,
කොළඹ 03.

13. කීර්ති ගුණවර්ධන මයා
කළමණාකාර අධ්‍යක්ෂ (ලකීයෝගට්)
199, හයිලෙවල් පාර,
මාකුඹුර,
කොට්ටාව.

14. නිතීශ්‍රද පී.ආරියසේන මයා
100/29, වීරකෝන් වලව්වත්ත,
හිත්තැටිය, මාතර.

15. ආචාර්ය ලකිත් පීරිස් මයා
ප්‍රධාන විධායක නිලධාරී,
ලංකා හොස්පිටල් පුද්ගලික සමාගම,
578, ඇල්විටිගල මාවත,
කොළඹ 05.


Board of Mangement
Chairman / CEO
Vice Chairman
Director General
Director Admin. & H.R.
Director Training
Institutes / Districts
Director Quality
Director Planning & Monitoring
Director Finance
Internal Auditor
A.D. General Admin
A.D. Maint.& Constr.
A.D. HRM
A.D. HRD
A.D. Training Service
A.D. Training Admin
A.D. SIT
A.D. OJT
A.D. C.G.& Marketing
A.D. Quality
A.D. NSS
A.D. Asses ment
A.D. Certifi cate
A.D. Information Systems
A.D. Planning
A.D. Monito ring
A.D. Acc. & Controll
I.A.O
VRU Officer
A.O.
T.O.
T.O.
T.O.
T.O.
T.O.
T.O.
Q.A. Off.
T.O.
T.O.
T.O.
Sys. Adm
D.B Adm
Stat. cian
T.O.
Acct. Officer
Proc. Officer
Acct. Officer
B/ Sec Leg.Off
Trp. Officer
Tech. Officer
Transl ator.
Inspec
Inspec.
Inspec.
Inspec.
Inspec.
Inspec.
Inspec.
Inspec.
Inspec.
Inspec.
Book Keeper
M.A.
M.A.
Drft.M. M.A.
M.A.
M.A.
Management Asst.
Management Asst.
Management Asst.
Management Asst.
Drivers
Office Aide
Office Aide
Office Aide
Office Aide
Office Aide
Office Aide

04.අධිකාරියේ අරමුණු

සංස්ථාපිත කිරීමේ පනතෙහි අංක 37 (1) දරණ ඡේදය අනුව අධිකාරියේ පරමාර්ථ පහත පරිදි වේ.

(අ) වෘත්තීය පුහුණුව සැලසුම් කිරීම, සංවිධානය කිරීම හා ලබාදීම.

(ආ) වෘත්තීය පුහුණුවට අදාල පුහුණු සම්මතයන් නිශ්චය කිරීම.

(ඇ) වෘත්තීය පුහුණුවට අදාලව විභාග පැවැත්වීම හා සහතික පත්‍ර සහ වෙනත් ප්‍රධානයන් නිකුත් කිරීම.

(ඈ) ජාතික ශිල්පීය පරීක්ෂණය පැවැත්වීම.

(ඉ) වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් කිරීම.

(ඊ) විවිධ දක්ෂතා වැඩිදියුණු කිරීම ප්‍රවර්ධනය පිණිස තරඟ පැවැත්වීම.

(උ) වෘත්තීය පුහුණුව සලස්වන ආයතනවල සහ වෙනත් ආයතනවල පුහුණු කිරීමේ හැකියාවන් සංවර්ධනය කිරීම.

(ඌ) වෘත්තීය පුහුණු කිරීම් සම්බන්ධයෙන් වෘත්තීය පුහුණු කොමිෂන් සභාවට උපදෙස් දීම.

(එ) සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ සහ විදේශවල පිහිටි ආයතන සමඟ සම්බන්ධකම් ඇති සහතික, ඩිප්ලෝමා සහ උපාධි සමතත්වයෙහිලා සැලකීම සඳහා අදාල කටයුතු කිරීම සහ බලාත්මක කිරීම.

05. අධිකාරියේ ප්‍රධාන කාර්යයන් / වැඩසටහන්

(අ) රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධවී කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව ලබාදීම, පුහුණු ආයතන 03ක් සහ දිවයිනපුරා පිහිටුවා ඇති ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථාන මඟින් ද්විත්ව පුහුණුව ලබාදීම.

(ආ) වෙනත් වෘත්තීය පුහුණුවන්නන් සඳහා විවිධ ආයතන වලට යොමුකොට කාර්යස්ථ පුහුණුව ලබාදීම.

(ඇ) මොරටුව, පේරාදෙණිය සහ රුහුණු විශ්ව විද්‍යාලයන්හි ඉංජිනේරු උපාධි අපේක්ෂක සහ අනෙකුත් ඩිප්ලෝමා හදාරන සිසුන් සඳහා අවශ්‍ය යන්ත්‍රාගාර පුහුණුව ලබාදීම.

(ඈ) අවිධිමත් ලෙස නිපුණතාව ලැබූ කර්මාන්ත ශිල්පීන්ට පෙර ඇගයීම් ක්‍රමයට ජාතික වෘත්තීය සුදුසුකම් සහතික ලබාදීම, වෘත්තීයට අදාල පරිදි සුදුසුකම් සහතික ලබාදීම සහ අදාල ජාතික වෘත්තීය පරීක්ෂණ පැවැත්වීම.

(ඉ) වෘත්තීය පුහුණු ආයතන වල පුහුණුකරුවන් පුහුණු කිරීම.

(ඊ) පාසල් සිසුන්, පාසල් හැරගිය සහ අනෙකුත් ඉලක්ක කණ්ඩායම් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම.

06. පුහුණු ක්‍රමවේදය සහ අනෙකුත් ප්‍රධාන වැඩසටහන්

6.1 පුහුණු ක්‍රමවේදය

පුහුණු ක්‍රමවේදය ප්‍රධාන වශයෙන් කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව, ආයතනික පුහුණුව/ මධ්‍යස්ථාන පාදක ද්විත්ව පුහුණුව, යන්ත්‍රාගාර පුහුණුව, කාර්යස්ථ පුහුණුව ලෙස වර්ග කළ හැකිය.

- **කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව**

ආයතනය මඟින් පවත්වාගෙන යනු ලබන පුහුණු කටයුතු අතර ප්‍රධාන පුහුණු ක්‍රමවේදය මෙය වන අතර, කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණු කිරීම් සඳහා අධිකාරිය ලත් ශ්‍රී ලංකාවේ එකම රාජ්‍ය ආයතනය ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය වේ. මෙම පුහුණු ක්‍රමවේදයේදී පුහුණු වන්නන් පුහුණු කාලය තුළ වැඩ කරමින් ඉගෙන ගැනීම මඟින් අවශ්‍ය නිපුණතා ලබා ගන්නා අතර ඒ කර්මාන්ත සඳහා ඔහු හෝ ඇය අනුයුක්ත කරනු ලැබේ.

මෙහිදී පුහුණුලාභියා හට පහත ක්‍රමවේදයන් එකක් යටතේ පුහුණුව ලබා ගැනීමට හැකියාව ඇත.

i. කර්මාන්ත ශිල්පී ආධුනිකත්ව පුහුණුව
ii. ජාතික වෘත්තීය සුදුසුකම සහතික ක්‍රමය
iii. ස්ථානානුරූපී ආධුනිකත්ව පුහුණුව
iv. ග්‍රාමීය ආධුනිකත්ව පුහුණුව

- **කර්මාන්ත ශිල්පී ආධුනිකත්ව පුහුණුව**

එක් එක් ක්ෂේත්‍රයට විශේෂිත වූ ජාතික පුහුණු හා කර්මාන්ත උපදේශක කමිටුව (NITAC) මඟින් එක් එක් ක්ෂේත්‍රයන්ට පුහුණු සම්මතයන් පිළියෙලකොට එම පුහුණු සම්මතයන්ට අනුකූලව පුහුණු කටයුතු සිදු කිරීමට කර්මාන්ත හිමියන් හා ආධුනිකයා අතර ගිවිසුමකට එළඹීමෙන් පසු එක් එක් ආයතන වල ආධුනිකත්ව පුහුණුව ආරම්භ කළහැකිය.

- **ජාතික වෘත්තීය සුදුසුකම සහතික ක්‍රමය (NVQ)**

ආධුනිකත්ව පුහුණුව යටතේ වෘත්තීන් 25 පදනම් කරගෙන 2015 වර්ෂයේ සිට ආරම්භ කරන ලදි. මෙම ක්‍රමයේ දී කර්මාන්ත ශිල්පී ආධුනිකත්ව ක්‍රමයෙන් කර්මාන්ත හිමියන් හා ආධුනිකයා අතර ගිවිසුමකට එලබීමෙන් පසු එක් එක් පුහුණු ආයතනවල පුහුණුව ආරම්භ කළ හැකිය. මෙම ක්‍රමය තුල පුහුණු ආයතන /කර්මාන්ත තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම් සභාව යටතේ ප්‍රතිනතය කිරීමට සිදුකලයුතු අතර ආධුනිකයන් නිරන්තර ඇගයීමට ලක්කල යුතුය. පුහුණුව අවසානයේ දී තෘතීක හා වෘත්තීය පුහුණු කොමිසම් සභාවේ ලියාපදිංචි වී ඇති ඇගයීම් කරුවන් විසින් අවසාන ඇගයීම් පරීක්ෂණය සිදුකර ඒ ඒ මට්ටම සඳහා සහතික නිකුත් තරනු ලැබේ.

- **ස්ථානානුරූපී ආධුනිකත්ව පුහුණුව**

  මෙම පුහුණු ක්‍රමය යටතේ එක් එක් ප්‍රදේශයට ආවේනික වූ කර්මාන්තයෙහි පුහුණුව ලැබීමට ආධුනිකයින් යොමු කරන අතර අදාල පුහුණු සම්මතයන් අදාල ආයතනය හා අධිකාරිය සමඟ එක්ව පිළියෙල කරනු ලබයි.



- **ග්‍රාමීය මට්ටමේ ආධුනිකත්ව පුහුණුව**

  කර්මාන්ත ශිල්පීය මට්ටමේ වෘත්තීන් සඳහා සකස් කරන ලද පුහුණු සම්මතයන්ට අනුකූලව පුහුණුව ලබාදිය නොහැකි ආධුනිකයන් හට ග්‍රාමීය පුහුණු පහසුකම් උපයෝගී කර ගනිමින් ග්‍රාමීය මට්ටමේ සිටින පුහුණුලාභීන් හට පුහුණුව ලබාදීම ඉලක්ක කොට ග්‍රාමීය ආධුනිකත්ව පුහුණු ක්‍රමය හඳුන්වා දී ඇත. මේ සඳහා අවශ්‍ය කරන පුහුණු සම්මත එම ආයතනය සමඟ සාකච්ඡා කොට අධිකාරිය මඟින් පිළියෙල කරනු ලැබේ.

කර්මාන්ත පාදක කර්මාන්ත ශිල්පී ආධුනිකයන්ට සහ ජාතික වෘත්තීය සුදුසුකම සහතික ලාභීන්ට අදාල න්‍යායික දැනුම පුහුණුව මඟින් සහ දුරස්ථ අධ්‍යාපනය මඟින් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

තවද ආධුනිකයන් හට අවශ්‍ය මූලික න්‍යායික හා ප්‍රායෝගික දැනුම යම් කාල පරිච්ඡේදයකදී අදාල පුහුණු මධ්‍යස්ථානයක් මඟින් ලබා දෙන අතර තවදුරටත් ඔවුන්ට විෂය කරුණු ස්වයං අධ්‍යයනය සඳහා පහසුකම් සලසා දෙමින් මුද්‍රිත තැපැල් මාර්ගික පාඩම් මාලා/ මොඩියුලද අධිකාරිය මඟින් ලබා දෙනු ලැබේ. පාඩම්මාලා අවසානයේ ඇති ප්‍රශ්නාවලියට ආධුනිකයින් පිළිතුරු ලියා එවනු ලැබීමෙන් පසුව අදාල නිවැරදි කිරීම් කොට නැවතඔවුන් වෙත තැපැල් මඟින් යවනු ලැබේ.

මුද්‍රිත පාඩම්මාලා හැදෑරීමේදී පුහුණුවන්නන් මුහුණදෙන ගැටළු හා අපහසුතා නිරාකරණය කිරීමට කාලීනව සති අන්ත පන්ති අධිකාරිය විසින් සංවිධානය කරනු ලැබේ.

මීට අමතරව වෘත්තියට අදාල ඉංග්‍රීසි දැනුම දියුණු කර ගැනීම සඳහා ඉංග්‍රීසි පාඩම්මාලා ද මෙම ආධුනිකයන් වෙත ලබා දෙනු ලැබේ.

- **ආයතනික පුහුණු/ මධ්‍යස්ථාන පාදක ද්විත්ව පුහුණුව**

මෙම ක්‍රමය යටතේ ආධුනිකයින් කෙලින්ම ජාතික පුහුණු ආයතනයකට හෝ ප්‍රාදේශීය පුහුණු ආයතනයකට නියමිත කාලපරිච්ඡේදයකට අනුයුක්ත කර බඳවා ගනු ලබන අතර ඉන්පසුව පුද්ගලික හෝ රජයේ ආයතනයක කාර්යස්ථ පුහුණුව සඳහා යොමු කරනු ලැබේ. පුහුණු ආයතන හෝ පුහුණු මධ්‍යස්ථාන මඟින් අදාල න්‍යායික හා ප්‍රායෝගික දැනුම ලබාදෙනු ලැබේ. සමාලෝචිත වසර තුළ අධිකාරිය යටතේ ජාතික ආයතන තුනට (03)ට අමතරව දිවයිනේ විවිධ ප්‍රදේශ වල පුහුණු මධ්‍යස්ථාන 74ක් පවත්වාගෙන යන ලදී. මේවායේ පවත්වන ලද පාඨමාලාවල කාලය මාස 06 සිට අවුරුදු 04 දක්වා වෙනස් වේ.



- **<u>යන්ත්‍රාගාර පුහුණුව</u>**

1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 38 (සී) වගන්තියට අනුව මොරටුව, පේරාදෙණිය හා රුහුණු විශ්ව විද්‍යාලවල උපාධි අපේක්ෂකයින්ගේ ඉංජිනේරු උපාධි සඳහා ද විශ්ව විද්‍යාල සහ අනෙකුත් තෘතීය අධ්‍යාපන ආයතන මඟින් පවත්වාගෙන යනු ලබන ඩිප්ලෝමා පාඨමාලා සඳහා ද අදාල යන්ත්‍රාගාර පුහුණුව අධිකාරිය මඟින් ලබාදෙනු ලැබේ.

- **<u>කාර්යස්ථ පුහුණුව</u>**

අනෙකුත් වෘත්තීය පුහුණු ආයතන වල ආයතනික පුහුණුව සම්පූර්ණ කරන්නන් සඳහා හය මාසයක කාර්යස්ථ පුහුණුව අධිකාරිය මඟින් සපයනු ලබයි. විශේෂයෙන් කාර්මික විශ්ව විද්‍යාල, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,ජාතික තරුණ සේවා සභාව සහ අනෙකුත් පිළිගත් රජයේ / පෞද්ගලික ආයතන වල වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ පුහුණුව ලැබුවන්ට කාර්මික අංශයේ ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දීම සඳහා මෙම පුහුණුව ආරම්භ කොට ඇත.

කර්මාන්ත ශිල්පී ආධුනිකයින් සහ ජාතික ආධුනිකත්ව සහතික ක්‍රමය යටතේ පුහුණුව අවසන් කළ ආධුනිකයන් සඳහා අවසාන වෘත්තීය පරීක්ෂණය ප්‍රධාන කාර්යාලයේ ඇගයීම් අංශයෙන් පවත්වනු ලැබේ. එසේ වුවද පර්ෂද කාර්යාල පිහිටු වීමත් සමඟ මෙම කටයුතු විමධ්‍යගත කිරීමට අපේක්ෂා කරන බැවින් දැනට තුන් වන පර්ෂද යටතට ගැනෙන කොළඹ, ගම්පහ සහ රත්නපුර දිස්ත්‍රික්ක වල පමණක් එම පර්ෂද කාර්යාල මඟින් අවසාන වෘත්තීය පරීක්ෂණය සිදුකරනු ලැබේ.

මීට අමතරව ජාතික වෘත්තීය සුදුසුකම් පරීක්ෂණය (NVQ) සහ ජාතික වෘත්තීය පරීක්ෂණ (NTT) සම්බන්ධ ඇගයීම් ද ප්‍රධාන කාර්යාලය මඟින් සිදුකරයි.

ස්ථානරූපී සහ ග්‍රාමීය මට්ටමේ ආධුනිකයන් සඳහා වූ අවසාන වෘත්තීය පරීක්ෂණය අදාල දිස්ත්‍රික් කාර්යාලය විසින් පවත්වනු ලැබේ.

ජාතික ආයතනයන්හි සියලුම සහතිකපත් අධ්‍යක්ෂ / විදුහල්පති හෝ ලේඛකාධිකාරී සමඟ අධිකාරියේ සභාපතිතුමාගේ අත්සනින් යුතුව එම ආයතන මඟින් නිකුත් කරනු ලැබේ.



6.2 අනෙකුත් ප්‍රධාන වැඩසටහන්

- **<u>ජාතික වෘත්තීය පරීක්ෂණ හා ජාතික වෘත්තීය සුදුසුකම</u>**

  මෙම වැඩසටහන මගින් වෘත්තීය පරීක්ෂණ පවත්වා අදාල නිපුණතා ඇති ශිල්පීන් හට ප්‍රවීණතා සහතික නිකුත් කිරීම සිදුකරයි. අවිධිමත් පුහුණුව ලැබූ දැනට සේවා කරන නිපුණ ශිල්පීන්ට පිළිගත් වෘත්තීය සහතිකයක් ලබා ගැනීම මඟින් වඩා හොඳ දේශීය හා විදේශීය රැකියාවන් ලබා ගැනීම සඳහා මෙම ක්‍රමය වඩාත් භාවිත කරයි.

  දැනට පවතින වෘත්තීය පරීක්ෂණ III ශ්‍රේණිය, II ශ්‍රේණිය සහ I ශ්‍රේණිය ලෙස අර්ධ නිපුණ, නිපුණ, විශිෂ්ඨ නිපුණ ලෙස මට්ටම් 3 කින් පැවැත්වේ.

  ජාතික වෘත්තීය පරීක්ෂණ ක්‍රමය ජාතික නිපුණතා සම්මත නොමැති වෘත්තීන් 10 කට සහ ශ්‍රී ලංකා පරිගණක නිපුණතා සහතිකය නිකුත් කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබයි.

  ජාතික වෘත්තීය පරීක්ෂණ ක්‍රමය වර්තමානයේ දී ජාතික වෘත්තීය සුදුසුකම් සහතික ක්‍රමය (NVQ) යටතේ පවතින පෙර ඉගනුම් පසු ඇගයීම (RPL) බවට පරිවර්ථනය වෙමින් පවති.

  මේ සඳහා අවිධිමත් පුහුණුව ලැබූ දැනට සේවා කරන නිපුණ ශිල්පීන්ට පිළිගත් වෘත්තීය සහතිකයක් ලබා ගැනීම මඟින් වඩා හොඳ දේශීය හා විදේශීය රැකියාවන් ලබා ගැනීම සඳහා මඟපාදා දෙනු ලබයි.

- **<u>ජාතික නිපුණතා සම්මත සංවර්ධන</u>**

  අධිකාරිය මගින් වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයට අදාලව ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයක් වේ. ජාතික නිපුණතා සම්මත පිළියෙල කිරීමේ නීතිමය බලය පනත මඟින්ම අධිකාරිය වෙත පැවරී ඇත.

  තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගන්නා වෘත්තීන් සඳහා අදාල ජාතික නිපුණතා සම්මත සකස් කිරීම සහ වලංගු ගතකිරීම මේ යටතේ සිදු කෙරේ.

  ජාතික කාර්මික පුහුණු උපදේශක කමිටුවක් මඟින් සකස් කරනු ලබන ජාතික නිපුණතා සම්මත එක් එක් වෘත්තීන්ට අදාල සංවර්ධන කමිටුවක් මඟින් සංවර්ධනය කිරීම සහ පුනරීක්ෂණය කිරීම මෙහිදී සිදු කෙරේ.

  ජාතික කාර්මික පුහුණු උපදේශක කමිටුව එක් එක් ක්ෂේත්‍රයට සහ වෘත්තීන්ට විශේෂිත වූ පුද්ගලයින්ගෙන් සැලසුම්ලත් කමිටුවක් වන අතර මේ වන විට උපදේශක කමිටු 28 ක් පමණ හදුනාගෙන ඇත. මෙම එක් එක් කමිටුවකට සාමාජිකයන් 16 දෙනෙකු පමණ ඇතුළත් වේ.

- **<u>ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන</u>**

  පුහුණුවේ යෙදී සිටින සහ පුහුණුව අවසන්කළ යන කොටස් දෙක සඳහාම මෙම වැඩසටහන් පවත්වනු ලැබේ. මෙහි ප්‍රධාන ඉලක්කය පුහුණුව අවසන්කළ පසු ස්වයංරැකියා ආරම්භ කිරීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතාව ලබා දීම වේ.

- **<u>වෘත්තීය මාර්ගෝපදේශනය</u>**

පාසල් හැරගිය සහ පාසල් යන සිසුන්ගේ වෘත්තීය පුහුණුව පිළිබඳව සහ විශේෂයෙන් රුකියා වෙළඳපොළ පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.



- **<u>කාර්යාලමණ්ඩල සංවර්ධනය සහ පෞර්ෂත්ව සංවර්ධනය</u>**

නයිටා ආයතනයේ සේවකයින්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම වැඩසටහන් විවිධ අදියර යටතේ සිදුකරනු ලබන අතර ඔවුන්ගේ රුකියා වැඩකටයුතු වලට සිදුවන බාධාවන් අවම වන පරිදි පවත්වාගෙන යනු ලැබේ.

1) දත්ත නිරූපණය හා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය තුලදී විවිධ පුහුණු වර්ගීකරණයන් යටතේ ආධුනිකයින් 41,192 පුහුණුව සඳහා යොමු කර ඇත. මෙමඟින් නිරූපිත අගය 2014 වර්ෂය (31,464) සමඟ සැසඳීමේදී 30% වර්ධනයකි. (වගු අංක 01)

සමාලෝචිත වර්ෂය තුළ පුහුණුව අවසන් කිරීම 2014 වර්ෂයට සාපේක්ෂව ආසන්න වශයෙන් පවත්වාගෙන යාම විශේෂ ලක්ෂණයකි.

මෙම තොරතුරු තව දුරටත් විශ්ලේෂණය කිරීමේදී ස්ථානානුරූපී සහ පුහුණු මධ්‍යස්ථාන සඳහා බඳවා ගන්නා ලද ප්‍රමාණය අඩුවෙමින්, එම ප්‍රමාණයන් කර්මාන්ත ශිල්පී සහ කර්මාන්ත පාදක ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) ක්‍රමයන් සඳහා දෝලනය වී ඇති බව වගු අංක 01 අනුව පැහැදිලි වේ.

වගුව 01: පුහුණු කිරීමේ කාර්යයන්හී සාරාංශය (විවිධ පුහුණු වර්ගීකරණයන් යටතේ) - 2015

පුහුණු වර්ගය	පුහුණු කිරීම් මට්ටම	බඳවා ගැනීම්		පුහුණුව හැරයාම්		පුහුණුව සම්පූර්ණ කිරීම්		2015-12-31 දිනට පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව	
		2014	2015	2014	2015	2014	2015	2014	2015
1) කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව	1.1) කර්මාන්ත ශිල්පී	7667	6214	1799	2191	3264	4644	10326	9705
	1.2) ජාතික වෘත්තීය සුදුසුකම (NVQ)	2533	6551	175	1795	0	863	2358	6251
	1.3) ස්ථානානුරූපී	2593	2291	550	491	3211	1888	2972	2884
	1.4) ග්‍රාමීය මට්ටම	308	378	160	117	1156	202	278	337
	1.5) ජාතික ආධුනිකත්ව සහතික	0		33		84	8	8	0
2) මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව	2.1) දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන - පූර්ණ කාලීන	5509	5255	957	652	4525	4695	4842	4750
	2.3) දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන - අර්ධ කාලීන	1012	299	80	21	815	670	482	90
3) ජාතික ආයතන	3.1) ජාතික ආයතන - පූර්ණ කාලීන	1326	1173	143	187	975	1053	3215	3148
	3.2) ජාතික ආයතන - අර්ධ කාලීන	495	717	88	1	570	300	172	588
4) රැකියාස්ථ පුහුණුව (වෙනත් පුහුණු ආයතන)	4.1) දිස්ත්‍රික් කාර්යාල	1118	430	41	43	1034	491	208	104
	4.2) ප්‍රධාන කාර්යාලය	2482	9610		208	1692	3615	790	6577
5) යන්ත්‍රාගාර පුහුණුව	5.1) උපාධි අපේක්ෂක, ඩිප්ලෝමා සහ වෙනත් සිසුන්	6421	8274	0		6924	5625	2482	5131
එකතුව		31464	41192	4026	5706	24250	24054	28133	39565

පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුල පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින්ද ඇත .

සමාලෝචිත වර්ෂය තුලදී විවිධ පුහුණු ක්‍රමවේදයන් පිළිබඳව වෙන වෙනම සලකා බැලීමේ දී කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුවේ වර්ධණයක් පෙර වර්ෂයට සාපේක්ෂව වාර්තා වී ඇත. ඒ අතර විශේෂ තැනක් කර්මාන්ත පාදක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ක්‍රමයට හිමිවේ. එම සංඛ්‍යාව 2014 වර්ෂයට සාපේක්ෂව 160% වර්ධනයකි .
මෙම වර්ෂය තුළදී මධ්‍යස්ථාන පාදක පුහුණු ක්‍රමවේදයන් අඩුවීමක් සිදුවී ඇත . එය ඉහළ කළමණාකාරීත්වය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් මත සිදු වී ඇත .ඒ වගේම විශේෂ කර්මාන්ත පුහුණුවේ සහ කාර්යස්ත පුහුණුවේ කැපීපෙනෙන වර්ධනයක් සිදුවී ඇත .

ප්‍රස්ථාර 01- විවිධ වර්ගීකරණයන් යටතේ පුහුණුවට බඳවා ගැනීම -2015



සමාලෝචිත වර්ෂයේ විවිධ පුහුණු ක්‍රම වේදයන් බෙදී ගිය ප්‍රකාරය ඉහත ප්‍රස්ථාරික නිරූපණයෙන් පිළිබිඹු වෙයි.

වගුව 02: පුහුණු කිරීමේ කාර්යයන්හී සාරාංශය (විවිධ පුහුණු වර්ගීකරණයන් යටතේ) - 2015

පුහුණු වර්ගය	පුහුණු කිරීම් මට්ටම	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			2015-12-31 දිනට පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
		පිරිමි	ගැහැණු	එකතුව	පිරිමි	ගැහැණු	එකතුව	පිරිමි	ගැහැණු	එකතුව	පිරිමි	ගැහැණු	එකතුව
1) කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව	1.1) කර්මාන්ත ශිල්පී	4344	1870	6214	1566	625	2191	3521	1123	4644	7755	1950	9705
	1.2) ජාතික වෘත්තීය සුදුසුකම (NVQ)	5296	1255	6551	1546	249	1795	750	113	863	5137	1114	6251
	1.3) ස්ථානානුරූපී	1445	846	2291	250	241	491	1237	651	1888	1839	1045	2884
	1.4) ග්‍රාමීය මට්ටම	187	191	378	11	106	117	76	126	202	186	151	337
	1.5) ජාතික ආධුනිකත්ව සහතික				0	0	0	7	1	8	0	0	0
2) මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව	2.1) දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන - පූර්ණ කාලීන	1933	3322	5255	242	410	652	1734	2961	4695	1733	3017	4750
	2.3) දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන - අර්ධ කාලීන	125	174	299	6	15	21	212	458	670	46	44	90
උප එකතුව		13330	7658	20988	3621	1646	5267	7537	5433	12970	16696	7321	24017
3) ජාතික ආයතන	2.2) ජාතික ආයතන - පූර්ණ කාලීන	1015	158	1173	159	28	187	896	157	1053	2732	416	3148
	2.2) ජාතික ආයතන - අර්ධ කාලීන	666	51	717	1	0	1	241	59	300	556	32	588
	උප එකතුව	1681	209	1890	160	28	188	1137	216	1353	3288	448	3736
	එකතුව	15011	7867	22878	3781	1674	5455	8674	5649	14323	19984	7769	27753
4) රැකියාස්ථ පුහුණුව (වෙනත් පුහුණු ආයතන)	4.1) දිස්ත්‍රික් මට්ටමින්	185	245	430	25	18	43	246	245	491	49	55	104
	4.2) ප්‍රධාන කාර්යාලය	5235	4375	9610	113	95	208	1940	1675	3615	3731	2846	6577
5) යන්ත්‍රාගාර පුහුණුව	5.1) උපාධි අපේක්ෂක, ඩිප්ලෝමා සහ වෙනත් සිසුන්	5876	2398	8274				4119	1506	5625	3726	1405	5131
	මුළු එකතුව	26307	14885	41192	3919	1787	5706	14979	9075	24054	27490	12075	39565

★★★ පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුල පසුගිය වර්ෂවල බඳවා ගන්නා ලද ආධුනිකයන්ද ඇතුලත් වේ.

සමාලෝචිත වර්ෂය තුලදී විවිධ වර්ගීකරණයන් යටතේ බඳවාගැනීම ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙනස් වීම වගු අංක 02 න් පෙන්නුම් කරයි.

සමාලෝචිත වර්ෂය තුලදී පුහුණුව සඳහා යොමු කරන ලද ආධුනිකයින්ගෙන් 64%ක් පුරුෂ පාර්ශවය නියෝජනය කරන අතර 36%ක් කාන්තා පාර්ශවය නියෝජනය කරයි. (ප්‍රස්ථාර 03)

පුහුණු මධ්‍යස්ථාන සඳහා කාන්තා ප්‍රතිශතය ඉහල ප්‍රතිශතයක් වාර්තා කළ ද කර්මාන්ත පදනම් කරගත් ආධුනිකත්ව පුහුණු ක්‍රමවේදයේදී කාන්තාවන්ගේ සහභාගිත්වය සැලකිය යුතු ලෙස අඩු වී ඇත.

ප්‍රස්ථාර 03 - ස්ත්‍රී පුරුෂ භාවය අනුව පුහුණුවට ඇතුලත් වීම.



2015 වර්ෂය අවසාන වන විට විවිධ වර්ගීකරණයන් යටතේ ආධුනිකයන් 39,565 ක් පුහුණුවේ රැඳී සිටි අතර වගුව 02 සහ ප්‍රස්ථාර 04 ට අනුව වැඩිම ආධුනිකයින් ප්‍රමාණයක් කර්මාන්ත ශිල්පී ක්‍රමවේදය යටතේ පුහුණු වූ ආධුනිකයින්ය. එම සංඛ්‍යාව 9,705 ක් වන අතර මුළු ආධුනික සංඛ්‍යාවෙන් 24% කි. ඒ වගේම මුළු ආධුනික සංඛ්‍යාවෙන් 17% ක් කාර්යස්ථ පුහුණුවේ නියැලෙන වෙනත් පුහුණු ආයතනවල ආධුනිකයන් නියෝජනය කරයි. එම සංඛ්‍යාව 6,681 ලෙස වාර්තා වන විට ජාතික වෘත්තීය පුහුණුව යටතේ ආධුනිකයන් 6,251ක් පුහුණුවේ රැඳී සිට ඇත .

ප්‍රස්ථාර 04 - වර්ෂය අවසාන වන විට විවිධ වර්ගීකරණයන් යටතේ පුහුණුවේ රැඳී සිටීම.



වගුව 03: පුහුණු කිරීමේ කාර්යයන්හි සාරාංශය (දිස්ත්‍රික් සහ අනෙකුත් පුහුණු වර්ගීකරණයන් යටතේ)-2015

පළාත	දිස්ත්‍රික්කය	බඳවාගැනීම්			පුහුණුව හැරයාම්***			පුහුණුව සම්පූර්ණ කිරීම් ***			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව 2015-12-31		
		පිරිමි	ගැහැණු	එකතුව	පිරිමි	ගැහැණු	එකතුව	පිරිමි	ගැහැණු	එකතුව	පිරිමි	ගැහැණු	එකතුව
බස්නාහිර	කොළඹ	2047	1105	3152	251	97	348	1786	798	2584	3012	1256	4268
	ගම්පහ	775	248	1023	287	74	361	467	160	627	1116	311	1427
	කළුතර	633	257	890	297	110	407	204	224	428	682	255	937
මධ්‍යම	මහනුවර	457	321	778	167	52	219	255	295	550	515	284	799
	මාතලේ	307	154	461	127	38	165	140	129	269	292	119	411
	නුවරඑළිය	176	266	442	82	26	108	81	212	293	204	241	445
දකුණ	ගාල්ල	890	490	1380	329	143	472	406	304	710	1134	418	1552
	මාතර	862	429	1291	194	91	285	402	302	704	981	415	1396
	හම්බන්තොට	413	383	796	230	155	385	218	235	453	427	292	719
උතුර	යාපනය	516	438	954	88	91	179	272	241	513	633	433	1066
	මන්නාරම	286	168	454	12	12	24	72	108	180	450	167	617
	වව්නියා	301	180	481	86	41	127	197	136	333	328	175	503
	මුලතිව්	117	91	208	16	8	24	47	29	76	194	91	285
	කිලිනොච්චිය	363	209	572	91	40	131	219	80	299	523	245	768
නැගෙනහිර	මඩකලපුව	816	222	1038	36	2	38	426	149	575	1408	230	1638
	අම්පාර	664	358	1022	195	98	293	227	296	523	840	202	1042
	ත්‍රිකුණාමලය	757	352	1109	106	43	149	498	274	772	924	321	1245
වයඹ	කුරුණෑගල	499	346	845	234	119	353	229	240	469	472	268	740
	පුත්තලම	316	266	582	96	53	149	114	176	290	307	222	529
උතුරු මැද	අනුරාධපුර	307	300	607	105	29	134	171	227	398	450	274	724
	පොලොන්නරුව	588	80	668	28	13	41	409	44	453	350	75	425
ඌව	බදුල්ල	466	320	786	266	140	406	298	207	505	466	270	736
	මොණරාගල	162	230	392	44	48	92	151	167	318	275	252	527
සබරගමුව	රත්නපුර	427	311	738	136	63	199	278	351	629	440	258	698
	කෑගල්ල	370	379	749	143	78	221	216	294	510	322	302	624
උප එකතුව		13515	7903	21418	3646	1664	5310	7783	5678	13461	16745	7376	24121
ජාතික ආයතන		1681	209	1890	160	28	188	1137	216	1353	3288	448	3736
රැකියාස්ථ පුහුණුව -ප්‍රධාන කාර්යාලය		5235	4375	9610	113	95	208	1940	1675	3615	3731	2846	6577
යන්ත්‍රාගාර පුහුණුව		5876	2398	8274				4119	1506	5625	3726	1405	5131
එකතුව		26307	14885	41192	3919	1787	5706	14979	9075	24054	27490	12075	39565

★★★ පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුල පසුගිය වර්ෂවල බඳවා ගන්නා ලද ආධුනිකයන්ද ඇතුලත් වේ.

වගුව 04: පුහුණු කිරීමේ කාර්යයන්හි සාරාංශය (දිස්ත්‍රික් සහ අනෙකුත් පුහුණු වර්ගීකරණයන් යටතේ)-2015

දිස්ත්‍රික්කය	පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව වර්ෂය අවසන් වන විට		බඳවාගැනීම්		මුළු ආධුනික සංඛ්‍යාව		පුහුණුව හැරයාම්		පුහුණුව හැරයාම් %		පුහුණුව සම්පූර්ණ කිරීම්		පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව වර්ෂය අවසන් වන විට	
	1		2		3=1+2		4		5		6		7=3-(4+6)	
	2013	2014	2014	2015	2014	2015	2014	2015	2014	2015	2014	2015	2014	2015
කොළඹ	3253	4048	2860	3152	6113	7200	164	348	3%	5%	1901	2584	4048	4268
ගම්පහ	1424	1392	986	1023	2410	2415	295	361	12%	15%	723	627	1392	1427
කළුතර	526	882	920	890	1446	1772	189	407	13%	23%	375	428	882	937
මහනුවර	732	790	956	778	1688	1568	144	219	9%	14%	754	550	790	799
මාතලේ	323	384	427	461	750	845	117	165	16%	20%	249	269	384	411
නුවරඑළිය	261	404	517	442	778	846	73	108	9%	13%	301	293	404	445
ගාල්ල	1107	1354	1340	1380	2447	2734	454	472	19%	17%	639	710	1354	1552
මාතර	1206	1094	954	1291	2160	2385	112	285	5%	12%	954	704	1094	1396
හම්බන්තොට	565	761	787	796	1352	1557	184	385	14%	25%	407	453	761	719
යාපනය	1043	804	977	954	2020	1758	192	179	10%	10%	1024	513	804	1066
මන්නාරම	223	367	385	454	608	821	71	24	12%	3%	170	180	367	617
වව්නියා	488	482	455	481	943	963	120	127	13%	13%	341	333	482	503
මුලතිව්	202	177	225	208	427	385	53	24	12%	6%	197	76	177	285
කිලිනොච්චිය	335	626	617	572	952	1198	102	131	11%	11%	224	299	626	768
මඩකලපුව	988	1213	1001	1038	1989	2251	69	38	3%	2%	707	575	1213	1638
අම්පාර	771	836	1105	1022	1876	1858	281	293	15%	16%	759	523	836	1042
ත්‍රිකුණාමලය	854	1057	1075	1109	1929	2166	163	149	8%	7%	709	772	1057	1245
කුරුණෑගල	711	717	790	845	1501	1562	262	353	17%	23%	522	469	717	740
පුත්තලම	344	386	339	582	683	968	20	149	3%	15%	277	290	386	529
අනුරාධපුර	718	649	749	607	1467	1256	192	134	13%	11%	626	398	649	724
පොලොන්නරුව	100	251	430	668	530	919	32	41	6%	4%	247	453	251	425
බදුල්ල	758	861	747	786	1505	1647	164	406	11%	25%	480	505	861	736
මොණරාගල	458	545	433	392	891	937	28	92	3%	10%	318	318	545	527
රත්නපුර	699	788	891	738	1590	1526	92	199	6%	13%	710	629	788	698
කෑගල්ල	529	606	774	749	1303	1355	222	221	17%	16%	475	510	606	624
උප එකතුව	18618	21474	20740	21418	39358	42892	3795	5310	10%	12%	14089	13461	21474	24121
ජාතික ආයතන	3342	3387	1821	1890	5163	5277	231	188	4%	4%	1545	1353	3387	3736
රැකියාස්ථ පුහුණුව - ප්‍රධාන කාර්යාලය		790	2482	9610	2482	10400		208	0%	2%	1692	3615	790	6577
යන්ත්‍රාගාර පුහුණුව		2482	6421	8274							6924	5625	2482	5131
එකතුව	21960	28133	31464	41192	47003	58569	4026	5706			24250	24054	28133	39565

සමාලෝචිත වර්ෂයතුල සියළුම වර්ගීකරණයන් යටතේ සිදුකරනු ලැබූ පුහුණුව දිස්ත්‍රික් සහ අනෙකුත් වර්ගීකරණයන් යටතේ දක්වා ඇත . (වගුව 03 සහ වගුව 04) මෙම වගුවලට අනුව දිස්ත්‍රික් මට්ටමින් පෙන්නුම් කර ඇති දිස්ත්‍රික් අගයන්හි ආධුනිකත්ව සහ මධ්‍යස්ථාන පුහුණුවට අමතරව දිස්ත්‍රික් මට්ටමින් සිදු කරනු ලැබූ කාර්යස්ථ පුහුණුවේ (OJT) ආධුනිකයන්ද ඇතුලත් වේ.

ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කයේ ආධුනිකයන් 3,152ක් පුහුණුව සඳහා බඳවාගෙන ඇති අතර එය ඉහලම බඳවා ගැනීම් ලෙස වාර්තාවේ. ආධුනිකයන් 208 ක් බඳවා ගත් මුලතිව් අඩුවෙන්ම ආධුනිකයන් බඳවාගත් දිස්ත්‍රික්කය වෙයි.

වර්ෂය අවසානය වන විට පුහුණුව අවසන් කිරීම පිළිබඳ සමාලෝචනය කිරීමේදී ආධුනිකයන් 2,584ක් කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තාවන විට මුලතිව් දිස්ත්‍රික්කයෙන් පුහුණුව අවසන් කරන්නේ ආධුනිකයින් 76කි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ආධුනිකයන් 4,258 ක් කොළඹ දිස්ත්‍රික්කය වාර්තාවන අතර මුලතිව් දිස්ත්‍රික්ය එම ප්‍රමාණය 285 කි.ඉහත 3 වගුවෙන් දක්වා ඇති තොරතුරු 2014 වර්ෂය සමඟ සංසන්දනාත්මක විග්‍රහයක් වගුව 4 මගින් පෙන්නුම් කර ඇත .

2) පුහුණුව හැර යාම පිළිබඳ විශ්ලේෂණය

සමස්ථයක් වශයෙන් අධ්‍යයනය කිරීමේදී 2015 වර්ෂය තුළ ආධුනිකයින් 5706 ක් පුහුණුව අතර මඟදී පුහුණුව හැර ගොස් ඇත. මෙය මුළු ආධුනික සංඛ්‍යාවෙන් 8% කි. 2014 වර්ෂය සමඟ සංසන්දනය කිරීමේදී පුහුණුව හැරයාමෙහි තරමක වැඩිවීමක් සිදු වී ඇත. (ප්‍රස්ථාර 05)

ප්‍රස්ථාර 05 - මුළු ආධුනික සංඛ්‍යාව සාපේක්ෂව පුහුණුව හැරයාම



(මුළු ආධුනික සංඛ්‍යාව = පසුගිය වසරේ සිට පුහුණුවේ රැඳි සිටි සංඛ්‍යාව + සමාලෝචිත වර්ෂයේ බඳවා ගැනීම)

ඒ වගේම 2015 වර්ෂයේ බඳවාගැනීම් වලින් ආධුනිකයින් 2557 ක් පුහුණුව හැරගොස් ඇත. මෙය බඳවාගැනීම් වලින් 6.2% කි. 2014 වර්ෂයේ මෙම සංඛ්‍යාව බඳවා ගැනීම් වලින් 6% හැටියට වාර්තා වී ඇත.

ප්‍රස්ථාර 06 - අදාල වර්ෂයේ බඳවා ගැනීම් වලට සාපේක්ෂව පුහුණුව හැර යාම.



පහත ප්‍රස්ථාර 07 සටහන තුලින් පෙන්වා ඇත්තේ පසුගිය වර්ෂ 10 ක මුළු ආධුනික සංඛ්‍යාවට සහ බඳවා ගැනීම් වලට සාපේක්ෂව පුහුණුව හැරයාම සිදු වී ඇති ආකාරයයි. ඒ අනුව මුළු ආධුනික සංඛ්‍යාවට සහ බඳවා ගැනීම් වලට සාපේක්ෂව පුහුණුව හැරයාම අඩුවී ඇති බව පැහැදිලි වේ.

ප්‍රස්ථාර 07



පුහුණුව හැර යාම දිස්ත්‍රික් මට්ටමින් විශ්ලේෂණය කිරීමේදී වැඩිම පුහුණුව හැරයාමේ ප්‍රතිශතයක් බදුල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. එය මුළු ආධුනික සංඛ්‍යාවට සාපේක්ෂව 25 %කි. ඒ වගේම 2015 වර්ෂයේ බඳවා ගැනීම් වලට සාපේක්ෂව 26% බදුල්ල දිස්ත්‍රික්කයෙන්ද 24% කුරුණෑගල දිස්ත්‍රික්කයෙන්ද 22% ක් හම්බන්තොට දිස්ත්‍රික්කයෙන්ද වාර්තාවේ. පුහුණුව හැරයාමේ ප්‍රතිශතය අඩුම දිස්ත්‍රික්කය ලෙස

මඩකලපුව දිස්ත්‍රික්කය වාර්තා වී ඇත. සමස්ථයක් වශයෙන් ගත්කල පුහුණුව හැරයාමේ ප්‍රතිශතය 8% මට්ටමේ පැවතියද දිස්ත්‍රික් වෙන්කර සැලකීමේ දී එය 12 % ක් ලෙස වාර්තා වී ඇත .

වගුව 05: පුහුණුව හැර යාම (දිස්ත්‍රික් මට්ටමින්)-2015

දිස්ත්‍රික්කය	බඳවාගැනීම	පුහුණුව හැරයාම බඳවාගැනීම්ට සාපේක්ෂව	%	මුළු ආධුනික සංඛ්‍යාව	පුහුණුව හැරයාම මුළු ආධුනික සංඛ්‍යාවට සාපේක්ෂව	%
කොළඹ	3152	286	9%	7200	348	5%
ගම්පහ	1023	98	10%	2415	361	15%
කළුතර	890	159	18%	1772	407	23%
මහනුවර	778	116	15%	1568	219	14%
මාතලේ	461	68	15%	845	165	20%
නුවරඑළිය	442	81	18%	846	108	13%
ගාල්ල	1380	157	11%	2734	472	17%
මාතර	1291	141	11%	2385	285	12%
හම්බන්තොට	796	177	22%	1557	385	25%
යාපනය	954	67	7%	1758	179	10%
මන්නාරම	454	1		821	24	3%
වව්නියා	481	47	10%	963	127	13%
මුලතිව්	208	5	2%	385	24	6%
කිලිනොච්චිය	572	10	2%	1198	131	11%
මඩකලපුව	1038	10	1%	2251	38	2%
අම්පාර	1022	142	14%	1858	293	16%
ත්‍රිකුණාමලය	1109	85	8%	2166	149	7%
කුරුණෑගල	845	207	24%	1562	353	23%
පුත්තලම	582	109	19%	968	149	15%
අනුරාධපුර	607	30	5%	1256	134	11%
පොලොන්නරුව	668	50	7%	919	41	4%
බදුල්ල	786	208	26%	1647	406	25%
මොණරාගල	392	28	7%	937	92	10%
රත්නපුර	738	130	18%	1526	199	13%
කෑගල්ල	749	144	19%	1355	221	16%
උප එකතුව	21418	2556	12%	42892	5310	12%

3) කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව සහ මධ්‍යස්ථාන පාදක ද්වත්ව පුහුණුව

අප අධිකාරියේ ප්‍රධානතම පුහුණු ක්‍රම වේදය වන කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව සහ මධ්‍යස්ථාන පාදක ද්වත්ව පුහුණුව යටතේ (විශේෂ කර්මාන්ත පුහුණුව සහ කාර්යස්ථ පුහුණුව හැර) 2015 වරුෂයේදී ආධුනිකයින් 22,878 ක් බඳවාගෙන ඇත.මෙම සංඛ්‍යාව ඉලක්කගත ආධුනිකයින් ප්‍රමාණයෙන් 85% ක ලඟාකර ගැනීමකි. මෙම ප්‍රමානය 2014 වර්ෂයට සාපේක්ෂව ප්‍රමාණාත්මක වශයෙන් වැඩි වීමකි.(ප්‍රස්ථාර 08)

ප්‍රස්ථාර 08 - ඉලක්ක සහ බඳවා ගැනීම්



පහත ප්‍රස්ථාර 09 සටහන මඟින් පෙන්නුම් කරන ලද බඳවා ගැනීම් ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය යටතේ සහ අනෙකුත් වශයෙන් වර්ගීකරණය කිරීමේදී 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමයේ කැපීපෙනෙන වර්ධනයක් පෙන්නුම් කර ඇත. එනම් සමාලෝචන වර්ෂයේදී 2014 වර්ෂයට සාපේක්ෂව 48% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

ප්‍රස්ථාර 09 - ජාතික වෘත්තීය සුදුසුකම සඳහා බඳවාගැනීම.



දිස්ත්‍රික් මට්ටමින් විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය තුළ දී දිස්ත්‍රික් මට්ටමින් විශ්ලේෂණය කිරීමේදී සමස්ථයක් වශයෙන් සියළු වර්ගීකරණයන් යටතේ (ජාතික ආයතන සහ යන්ත්‍රාගාර පුහුණුව හැර) ඒ ඒ දිස්ත්‍රික්කයන්හි කාර්යය සාධනය පහත වගුවෙන් පෙන්නුම් කරයි.

වගුව 06: කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව සහ මධ්‍යස්ථාන පාදක ද්වත්ව පුහුණුව- දිස්ත්‍රික් මට්ටමින් (ජාතික ආයතන හැර)2015

පළාත	දිස්ත්‍රික්කය	බඳවාගැනීම			පුහුණුව හැරයාම්***			පුහුණුව සම්පූර්ණ කිරීම් ***			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව 2015-12-31		
		පි	ගැ	එ	පි	ගැ	එ	පි	ගැ	එ	පි	ගැ	එ
බස්නාහිර	කොළඹ	2018	1087	3105	251	97	348	1732	777	2509	3006	1253	4259
	ගම්පහ	773	248	1021	287	74	361	450	159	609	1116	311	1427
	කළුතර	630	252	882	297	110	407	203	215	418	680	254	934
මධ්‍යම	මහනුවර	455	318	773	167	52	219	250	292	542	515	284	799
	මාතලේ	300	136	436	127	38	165	133	113	246	290	117	407
	නුවරඑළිය	176	266	442	82	26	108	81	212	293	204	241	445
දකුණ	ගාල්ල	890	489	1379	329	143	472	404	301	705	1134	417	1551
	මාතර	862	429	1291	194	91	285	402	302	704	981	415	1396
	හම්බන්තොට	412	379	791	230	155	385	217	229	446	427	292	719
උතුර	යාපනය	460	382	842	66	79	145	219	186	405	622	428	1050
	මන්නාරම	274	143	417	12	12	24	63	92	155	446	158	604
	වව්නියා	293	171	464	86	41	127	185	126	311	328	175	503
	මුලතිව්	117	91	208	16	8	24	45	20	65	194	91	285
	කිලිනොච්චිය	354	209	563	91	40	131	209	80	289	520	245	765
නැගෙනහිර	මඩකලපුව	807	189	996	36	2	38	416	134	550	1407	212	1619
	අම්පාර	660	355	1015	192	95	287	202	285	487	840	202	1042
	ත්‍රිකුණාමලය	743	324	1067	106	42	148	490	240	730	912	312	1224
වයඹ	කුරුණෑගල	494	334	828	234	117	351	221	230	451	469	267	736
	පුත්තලම	312	260	572	96	53	149	114	175	289	303	216	519
උතුරු මැද	අනුරාධපුර	307	300	607	105	29	134	168	227	395	450	274	724
	පොලොන්නරුව	588	80	668	28	13	41	409	44	453	350	75	425
ඌව	බදුල්ල	466	320	786	266	140	406	298	207	505	466	270	736
	මොණරාගල	162	230	392	44	48	92	151	167	318	275	252	527
සබරගමුව	රත්නපුර	407	289	696	136	63	199	259	328	587	439	258	697
	කෑගල්ල	370	377	747	143	78	221	216	292	508	322	302	624
උප එකතුව		13330	7658	20988	3621	1646	5267	7537	5433	12970	16696	7321	24017

★★★දිස්ත්‍රික් මට්ටමින් කාර්යස්ථ පුහුණුව සඳහා යොමු කරන ලද අනෙකුත් වෘත්තීය පුහුණු ආයතන වල ආධුනිකයන්ද ඇතුලත් නොවේ.
★★★ පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුල පසුගිය වර්ෂවල බඳවා ගන්නා ලද ආධුනිකයන්ද ඇතුලත් වේ.

ඉහත වගු අංක 06 ට අනුව ආධුනිකයින් 3,105 ක් බඳවා ගත් කොළඹ දිස්ත්‍රික්කය වැඩිම ආධුනිකයින් සංඛ්‍යාවක් බඳවාගත් දිස්ත්‍රික්කය ලෙස වාර්තාවිය. ඒ වගේම ආධුනිකයන් 1,379, 1,291 සහ 1,067 බඳවා ගත් ගාල්ල, මාතර, ත්‍රිකුණාමළය දිස්ත්‍රික්කයන් පිළිවෙලින් ඉහල බඳවාගැනීම් වාර්තා කළ දිස්ත්‍රික්කයන් හැටියට වාර්තා විය. ආධුනිකයින් 208 ක් බඳවා ගත් මුලතිව් දිස්ත්‍රික්කය අඩුම ආධුනිකයින් සංඛ්‍යාවක් බඳවා ගත් දිස්ත්‍රික්කය ලෙස වාර්තා විය.

ඒ වගේම පුහුණුව අවසන් කිරීම කොළඹ දිස්ත්‍රික්කයේ ආධුනිකයින් 2,509 ක් වාර්තාවන විට ත්‍රිකුණාමළය දිස්ත්‍රික්කයේ 730 ක් පුහුණුව අවසන් කර ඇත.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආධුනිකයින් 4,209 ක් වාර්තා කළ කොළඹ දිස්ත්‍රික්කය වැඩිම පුහුණුවේ රැඳී සිටි දිස්ත්‍රික්කය වේ. ඒවාගේම ආධුනිකයින් 285ක් පුහුණුවේ රැඳී සිටි මුලතිව් දිස්ත්‍රික්කය අඩුම පුහුණුවේ රැඳී සිටි දිස්ත්‍රික්කය විය.

සමාලෝචිත වර්ෂය තුල ආධුනිකයන් 20,988 ක් කර්මාන්ත පාදක ආධුනික්ත්ව පුහුණුව හා මධ්‍යස්ථාන පාදක පුහුණුව සඳහා බඳවාගෙන ඇත .මෙම වර්ෂය තුල ආධුනිකයින් 12,970 ක් දිස්ත්‍රික් මට්ටමින් පුහුණුව අවසන් කර ඇත . ඒ වගේම ආධුනිකයින් 24,017ක් වාර්ෂය අවසාන වන විට පුහුණුවේ රැඳී සිටීම වාර්තා විය.

ප්‍රාග්ධන ආධාර මුදල	59,350,000.00											59,350,000.00
බුදු මැදුර සඳහා දේශීය ආධාර	719,866.84									(719,866.84)		0.00
MYASD ආධාර	67,874,000.00										(67,874,000.00)	0.00
වර්ෂය තුළ ලාභය		2,013,927.14										2,013,927.14
ලියාපදිංචි ගාස්තුව												0.00
RDA විසින් දේශීය ආධාර												0.00
අර්ධ කාලීන ආදායම් මාරු අඩු වීම්							1,866,221.79	933,110.88				2,799,332.66
ගැළපීම්	187,675.50											187,675.50
මෙම කාලය තුළ ශුද්ධ හිඟය	(84,748,373.99)											(84,748,373.99)
ආදායම් ප්‍රකාශයට මාරු කරන ලද ප්‍රාග්ධන ආධාර	(5,037,711.65)											(5,037,711.65)
අර්ධ කාලීන ලාභ මාරු කිරීම්	(2,025,584.69)											(2,025,584.69)
පොත් අත්පත් කර ගැනීම්												0.00
විලම්බිත ප්‍රදාන මාරු කිරීම්	(65,794,966.85)											(65,794,966.85)
ආදායම් ප්‍රකාශයට මාරු කිරීම්	101,501.04											101,501.04
එකතුව	(526,764,316.32)	51,779,776.07	717,117,964.73	93,730.75	7,270,139.28	2,306,218.20	10,539,643.19	5,269,821.57	0.00	(719,866.84)	(67,874,000.00)	200,480,763.61

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
2015.12.31 දිනෙන් අවසන් වසර සඳහා වූ ගිණුම් ප්‍රතිපත්තීන්

සටහන 01
පොදු ගිණුම් ප්‍රතිපත්ති

1 වාර්තා කරන ආයතනය

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (මින් ඉදිරියට ආයතනය ලෙස කියවෙන) 1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ස්ථාපිත කොට ඇති අතර අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය යන ලිපිනයෙහි පිහිටා ඇත.

2. ගිණුම් සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත සහ පිළිගත් ගිණුම්කරණ මූල ධර්ම මත ආයතනයේ මූල්‍ය වාර්තා සකස් කර ඇත.

2.1 මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය මත සකස් කෙරේ.

2.2 මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා රුපියල් වලින් සටහන් කොට ඇත.

3 සංයන්ධනාත්මක තොරතුරු

3.1 පසුගිය වර්ෂයට අදාල අගයන් අදල වසරේ ඉදිරිපත් කිරීම් සමඟ අදාල වන පරිදි ගලපා ඇත

4. රජයේ ප්‍රදාන සහ ආධාර

4.1 රජයේ ප්‍රධාන මත ආයතනය යැපෙන අතර ඒවා ලැබීම් ලෙස සටහන් කර ඇත. පුනරාවර්ථන වියදම් සඳහා අදාල රජයේ ප්‍රධාන විස්තරාත්මක ආදායම් ප්‍රකාශයට බැර කර ඇති අතර ප්‍රාග්ධන වියදම් සඳහා ලැබීම් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අරමුදලට බැර කර ඇත.

4.2 වත්කම් මාරු කිරීම් ලෙස ලැබෙන රජයේ ප්‍රදානයන් විලම්බිත ආදායම ලෙස සලකා ඒවායේ ආයුකාලය අනුව ගිණුම් ගත කර ඇත.

5 වත්කම් සහ තක්සේරු කිරීම් පදනම

5.1 *තොග*

තොග සාමාන්‍යයෙන් පිරිවැය මත තක්සේරු කරනු ලැබේ. යල් පැන ගිය මුද්‍රිත ද්‍රව්‍ය තොග සඳහා 5%ක වෙන් කිරීමක් කර ඇත.

5.2 *ලැබිය යුතු දෑ*

ලැබිය යුතු දෑ උපලබ්දි අගය මත සඳහන් කර ඇති අතර 31.12.2015 දිනට සේවය හැර ගිය සේවක ණය සඳහා අඩමාන ණය වෙන් කිරීම 100%ක් වේ.අනෙකුත් බොල්ණය හා අඩමාන ණය සඳහා 5%ක වෙන් කිරීමක් කර ඇත.

5.3 දේපල පිරියත හා උපකරණ

අ. පිළිගැනීම් සහ මිනුම්

දේපල පිරියත සහ උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කිරීම් හෝ පාඩුව අඩු කිරීම මත දක්වා ඇත.

ආ. පිරිවැය

විදේශ ආධාර මත ලැබුණු/ උපකරණ හැර වෙනත් ස්ථාවර වත්කම් වල පිරිවැය ඒවා මිලදී ගැනීම හෝ ඉදිකිරීම් පිරිවැයෙන් හෝ ඒවා කෙලින්ම හේතුවන පිරිවැයෙන් යුක්තවේ.

ඉන්වෙන්ට්‍රි අයිතම

ඇ. කෙටිකාලීන අයිතම

ප්‍රාග්ධනීය කළ නොහැකි ඉන්වෙන්ට්‍රි අයිතම ආදායම් හා වියදම් ගිණුමට ලියා හරිනු ලැබේ. කෙසේ වුවද මෙම අයිතම ඉන්වෙන්ට්‍රි ලේඛණයේ ඇතුලත් කර භෞතික පාලනයට යටත් කොට ඇත.

ඇ. ක්ෂය වෙන්කිරීම

විවිධ ස්ථාවර වත්කම් වටිනාකම මත ආයුකාලය සලකා වර්ෂ අවසානයේ පහත අනුපාතයන් යටතේ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කර ඇත.

	ක්ෂය කිරීම් ප්‍රතිශතයන් බදු කාලය තුල ක්ෂය වීම මත
බදු ඉඩම්	
ගොඩනැගිලි	5%
යන්ත්‍රෝපකරණ	10%
ලී බඩු සවිකිරීම් සහ කාර්‍යාලීය උපකරණ	10%
පරිගණක සහ උපාංග	25%
පුස්තකාල පොත්	10%
මෝටර් රථ	25%

5.4 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ යටතේ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු, කෙටි කාලීන් අධි දවශීලී මුදල් බවට වහාම පත් කරගත හැකි ආයෝජන සඳහන් කර ඇත.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා අතැති මුදල් බැංකුවේ ඇති මුදල්. කෙටි කාලීන ආයෝජන සහ මාර්ගස්ථ මුදල් , මුදල් හා සමාන දේ ලෙසසලකා ඇත.

6. වගකීම සහ වෙන් කිරීම්

වගකීම්

ශේෂ පත්‍ර දිනෙන් වර්ෂයක් තුල හෝ ඉල්ලුම් කල විටකදී ගෙවිය යුතුදේ ජංගම වගකීම් ලෙස දක්වා ඇත. ශේෂ පත්‍ර දිනෙන් වර්ෂයක් හෝ ඊට වැඩි කාලයක් තුල නිරවුල් කල යුතු වගකීම් ජංගම නොවන වගකීම් ලෙස දක්වා ඇත.

6.1 පාරිතෝෂික වෙන්කිරීම්

වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා පාරිතෝෂික වෙන් කර ඇත. කෙසේ වුවද 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත සහ ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 16 අනුව වසර 05ක අඛන්ඩ සේවාකාලය සම්පූර්ණ කල සේවකයින් සඳහා බැඳීම් පවතී

6.1 පාරිතෝෂික වෙන්කිරීම්
වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා පාරිතෝෂික වෙන් කර ඇත. කෙසේ වුවද 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත සහ ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 16 අනුව වසර 05ක අඛණ්ඩ සේවාකාලය සම්පූර්ණ කල සේවකයින් සඳහා බැඳීම් පවතී

6.2 නිශ්චිත දායක මුදල් සැළසුම
අධිකාරිය විසින් සේවක දළ වැටුපෙන් සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් වෙනුවෙන් පිළිවෙලින් 15%, 3% නොවැඩි වන දායකත්වයක් දරනු ලබයි.

7. විස්තරාත්මක ආදායම් ප්‍රකාශය
අධිකාරියේ පුනරාවර්ථන වියදම් සඳහා රජයෙන් ලද ප්‍රතිපාදනයන් දේශීය සහ විදේශීය ආධාර (පුනරාවර්ථන) සහ විවිධ ආදායම් සහ වියදම් විස්තරාත්මක ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ. පුනරුත්තාපන සහ වැඩි දියුණු කිරීම් සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් වියදම් කල මුදල වත්කමෙහි අගය වැඩි කිරීම සඳහා නොයෙදූ අතර එය ආදායම් ගිණුමට ලියා හැර ඇත. තවද ඒ හා සමාන මුදලක් ජනල් සටහන් මගින් ප්‍රාග්ධන ප්‍රතිපාදන ගිණුමේ සිට විස්තරාත්මක ආදායම් ප්‍රකාශයට මාරු කර ඇත.

ආදායමට වැඩි අතිරික්තය / (ඌනතාවය) තීරණය කරනු ලබන්නේ සියළු දත්ත වගකීම් සහ ස්ථාවර වත්කම්වල ක්ෂය සඳහා වෙන් කිරීම් වලින් පසුව වේ.

අධිකාරියේ කටයුතු මෙහෙය වීමේදී සහ එහි ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම තත්වයෙන් පවත්වාගෙන යෑමේදී වැය වන සියළු වියදම් ආදායමෙන් අඩු කරනු ලැබේ. මෙහෙයුම් හා නඩත්තු කටයුතු වෙනුවෙන් දරණ ලද පුනරාවර්ථන වියදම් පහත අනුපාතිකයන් යටතේ දක්වා ඇත.

8. ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම්
සියලුම ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම් සළකාබලා ඇති අතර අවශ්‍ය ගැලපුම් හෝ හෙළිදරව් කිරීම් කර ගිණුම් ප්‍රකාශය සකස් කර ඇත.

9. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්
ශේෂපත්‍ර දිනෙන් පසු සිද්ධීන්ගේ වැදගත් කම සලකා අවශ්‍ය අවස්ථාවලදී ගැලපීම් කර ඇත.

10 රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව අංක PE/STBD/4/2007 දරණ 27/07/2007 දිනැති ලිපිය අනුව වෙන්කිරීම් ප්‍රමාණවත් නොවූ බැවින් වත්කම්,යන්ත්‍ර සහ උපකරණ සඳහා වත්කම් ප්‍රත්‍යාගණනය නොකරන ලදි.

11 රාජ්‍ය ව්‍යාපාර උපදේශන කාරක සභාවේ උපදෙස් පරිදි දීර්ඝ කාලීන ණය හිමි ශේෂයන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව ආදායමට මාරු කරන ලදි.

12 විලම්බිත ආදායම වැඩිවීම/ අඩුවීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙන් මුදල් නොවන ගණුදෙණු ලෙස සටහන් කරන ලදි.
අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව අර්ධ කාලීන පාඨමාලා ගිණුම සහ මධ්‍යම අරමුදල පහත පරිදි වෙන්කිරීම් සිදුකොට ඇත.

ඒකාබද්ධ අරමුදල	35%
ප්‍රාග්ධන අවශ්‍යතා අරමුදල	50%
බැඳීම් අවශ්‍යතා අරමුදල	50%

13 පහත සඳහන් අයිතමයන් සඳහා පසුගිය අවුරුදු සඳහා ගැලපීම් කර ඇත.

ජාතික ආධුනිකත්ව අධිකාරියේ කාර්යස්ථ පුහුණු අරමුණු	187,675.50
අර්ධකාලීන පාඨමාලා - ප්‍රධානකාර්යාලය හා පළාත් කාර්යාලය	322,138.15
විකුණුම් සහ අර්ධකාලීන පාඨමාලා - ආ.ඉ.අ.ආ.	330,737.50
විකුණුම් සහ අර්ධකාලීන පාඨමාලා - මෝ.ඉ.අ.ආ.	3,058.21

14 පාවිච්චිකරන ලද වත්කම් හා තොග ලාභ/අලාභ ප්‍රාග්ධන සංචිත ලෙස හඳුනාගනිමින් එම ප්‍රමාණය 2015 වර්ෂය තුල ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අරමුදලට මාරු කිරීම.

මගේ අංකය / எனது இல. / My No.: විවිවයි/ඊ/එන්ඒඅයිටීඒ/01/15/113

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2017 මාර්තු 01 දින

සභාපති

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 56(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත යථාකාලයේදී නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂයපථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු වූ කුලී රු. 180,000 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ආ) වාර්ෂික බදු කුලී රු. 99,000 ක් සහ ඉඩමක් බදු ගැනීමේ මූලික තැන්පතු රු. 297,000 ක් ඉඩම් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

2.2.3 නොසැසඳුනු පාලන ගිණුම්

ප්‍රාදේශීය කාර්යාල 3 ක් විසින් පවත්වා තිබූ බැංකු ගිණුම් 3 ක මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මුදල් ශේෂයට වඩා මුදල් පොතේ ශේෂය රු. 334,712 කින් වැඩි වී තිබූ අතර තවත් ගිණුමක ශේෂය මුදල් පොතේ ශේෂයට වඩා රු. 346,586 කින් අඩුවී තිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 56,146,515 ක් වූ ණයගැති ශේෂයෙන් වර්ෂ 05 ඉක්මවූ රු. 3,088,709 ක් වූ ණයගැති ශේෂ 35 ක් ද, වර්ෂ 03 ත් 05 ත් අතර පැවතෙන රු. 1,088,351 ක් වූ ණයගැති ශේෂ 03 ක් ද, වර්ෂ 01 ත් 03ත් අතර පැවතෙන රු. 51,969,455 ක් වූ ණයගැති ශේෂ 34 ක්ද පැවැතුණි.

(i) 1995 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළදී අධිකාරිය විසින් මිලදී ගැනීම් කටයුතු වෙනුවෙන් ලබාදී තිබූ රු. 571,196 ක් වූ අත්තිකාරම් හා අධිකාරියේ ජාතික මධ්‍යස්ථානයක් වෙත 2012 වර්ෂයේදී ලබා දී තිබූ රු. 763,476 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිරවුල් කරගෙන නොතිබුණි.

(ii) සේවක ණය ශේෂ තුල දීර්ඝ කාලයක සිට පැවත එන සේවය හැර ගිය සේවකයන්ගෙන් අයවිය යුතු රු. 104,328 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ 05 ඉක්මවූ රු.252,895 ක් වූ ණයහිමි ශේෂ 9 ක් ද වර්ෂ 03 ත් 05 ත් අතර රු. 117,525 ක්වූ ණයහිමි ශේෂ 02 ක් ද වර්ෂ 01 සිට 03 දක්වා වූ රු.12,766,539 ක ණයහිමි ශේෂ 45 ක්ද සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් කර නොතිබුණි.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට විවිධ ණය ගැති ශේෂයෙන් රු. 14,270,952 ක් ප්‍රධාන කාර්යාලය සහ ජාතික මධ්‍යස්ථාන 03 සහ දිස්ත්‍රික් මධ්‍යස්ථාන අතර ඇති වූ අභ්‍යන්තර ගනුදෙනු මත වූ ශේෂ විය. එදිනට ණයහිමි ශේෂය රු.13,136,958 ක් වූ අතර ඒ තුල අන්තර්ගත ඉහත පරිදි වූ ගනුදෙනු මත වූ ශේෂ රු. 8,256,064 ක් විය. මෙම අභ්‍යන්තර ගණුදෙනු මත වූ ණය ගැති හා ණයහිමි ශේෂ අතර වර්ෂ 5 ඉක්මවා තිබූ නමුත් නිරවුල් කර නොගත් රු.815,596 ක් වූ ශේෂ 14 ක් විය.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය රු. 43,942,849 ක් වූ අතර එයින් රු. 27,448,816 ක් ජාතික පුහුණු මධ්‍යස්ථාන තුනෙහි ආධුනිකයන්ගෙන් අයකර තිබූ රු. 5,000 බැගින් වූ ආපසු ගෙවිය යුතු තැන්පතුවලින් සමන්විත වී තිබුණි. ඉන් පුහුණුව අවසන් කර ආයතනයෙන් ඉවත්ව ගිය ආධුනිකයන් විසින් ආපසු ලබානොගත් ආසන්න වශයෙන් රු. 10,000,000 ක මුදලක් නිරවුල් කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය IX පරිච්ඡේදයේ 2.2 වගන්තිය	රාජ්‍ය නිලධාරීන් කාර්යාල වේලාවෙන් බැහැරව කරන ලද දේශන වෙනුවෙන් ලබන දීමනාවලින් සියයට 10 ක් රාජ්‍ය භාගය ලෙස ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ රු. 2,658,079 ක් වූ අධිකාරියේ අර්ධ කාලීන පාඨමාලාවල දේශන ගාස්තු මත රු. 265,807 ක් වූ රාජ්‍ය භාගය අයකර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 396 (ඇ)	නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්ම වූ එකතුව රු.510,100 ක් වූ චෙක්පත් 9ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර වර්ෂ 5 කට පෙර තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු. 26,211 ක් හා මුදල් ඇණවුම් 17 ක් සම්බන්ධයෙන්ද අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 702 (3)	සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි.
(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පී්ඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය	ගිණුම් සමඟ වාර්ෂික වාර්තාවේ කෙටුම්පත විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඇ)වගන්තිය	මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව හා අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය නොමැතිව මොඩියුල 11000 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් රු. 1,972,500 ක් ගෙවා තිබුණි.
(ඉ)	1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 53 වගන්තිය	ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අරමුදල නමින් අරමුදලක් පිහිටුවා භාණ්ඩාගාර ප්‍රදාන ඇතුළු සියළු ආදායම්ද හර කිරීමට සහ අනුමත සියළු වියදම් එයට බැර කර අතිරික්ත මුදල් භාණ්ඩාගාරයේ තැන්පත් කළ යුතු වේ. එසේ වුවද මධ්‍යම අරමුදල (Central Fund) නමින් අරමුදලක් පිහිටුවා තිබූ නමුත් එහි මෙහෙයුම් කටයුතු පනතේ සඳහන් පරිදි සිදු නොවූ අතර 2015 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු. 51,779,776 ක් භාණ්ඩාගාරයෙහි තැන්පත් කර නොතිබුණි.
(ඊ)	2006 දෙසැම්බර් 22 දිනැති අංක පී එෆ්/ 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අධිකාරිය තුල අරමුදල් 6 ක් පිහිටුවා තිබූ අතර 2015 දෙසැම්බර් 31 දිනට මෙම අරමුදල්වල ශේෂ එකතුව රු.25,479,552 ක් විය.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු. 84,748,374 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.19,566,476 ක් වීමෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.65,181,898 ක පිරිහීමක් ඇති වී තිබුණි. භාණ්ඩාගාර ප්‍රදාන රු. 35,000,000 කින් වැඩි වී පුහුණු වියදම් රු. 77,760,934 කින් අඩුවී තිබුණ ද පුද්ගලික පඩිනඩි රු. 151,042,770 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ඌනතාවයක් ඇති වී තිබූ අතර 2014 වර්ෂයේ දී රු. 19,566,476 ක් වූ ඌනතාවය සමාලෝචිත වර්ෂය වන විට රු. 84,748,374 ක් දක්වා වැඩි වී තිබුණි. කෙසේ වුවද, සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය ගැලපීමෙන් පසු 2011 වර්ෂයේ රු. 278,586,424 ක් වූ අධිකාරියේ දායකත්වය සමාලෝචිත වර්ෂය වන විට රු. 603,161,305 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

3.2 අධිකාරියට එරෙහිව හෝ අධිකාරිය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවකයන් තිදෙනෙකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම පැහැර හැරීම හා සේවයෙන් පහ කිරීම සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තුව විසින් අධිකාරියට එරෙහිව නඩු 02 ක් හා සේවයෙන් පහකිරීම, පරිතෝෂික නොගෙවීම හා සේවක අර්ථ සාධක අධිභාර අයකර ගැනීම සම්බන්ධයෙන් නිලධාරීන් සිව් දෙනෙකු විසින් අධිකාරියට එරෙහිව නඩු 03ක් පවරා තිබුණි.

(ආ) අධිකාරියට අයත් වැල්ලවත්ත පුහුණු මධ්‍යස්ථාන ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් අධිකාරිය විසින් බාහිර පාර්ශවයකට එරෙහිව නඩුවක් පවරා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනතෙහි අංක 37 (1) දරන ඡේදය අනුව අධිකාරියේ අරමුණු වූ වෘත්තීය පුහුණු සැලසුම් කිරීම හා ලබාදීම, පුහුණු සම්මතයන් නිශ්චය කිරීම, විභාග පැවැත්වීම වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් කිරීම, පුහුණු කිරීමේ හැකියාවන් සංවර්ධනය කිරීම සහ සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය ආයතන සමඟ සම්බන්ධකම් ඇති සහතික, ඩිප්ලෝමා සහ උපාධි සමත්වයෙහිලා සැලකීම සඳහා අදාල කටයුතු කිරීම සහ බලාත්මක කිරීම කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුලදී අධිකාරිය විසින් වෘත්තීය පුහුණුව සම්බන්ධයෙන් පර්යේෂණ හා සංවර්ධනයන් සිදුකිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටුකර නොතිබූ හා ප්‍රමාණවත් පරිදි ඉටුනොකළ කාර්යයන් පහත පරිදි වේ.

(i) ක්‍රියාකාරී සැලැස්ම අනුව ආධුනිකයන් 425 ක් සඳහා වූ පුහුණු වැඩසටහන් 40 ක් පවත්වා නොතිබුණු අතර සැලසුම් කර නොතිබූ පුහුණු වැඩසටහන් 21 ක් පවත්වා තිබුණි. ඒ සඳහා ආධුනිකයන් 699 දෙනෙකු සහභාගී වී තිබුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්ම තුල හඳුනාගෙන තිබූ නමුත් වර්ෂය තුළ පැවැත්වීම සඳහා සැලසුම් නොකර අතහැර දමා තිබූ පාඨමාලා සංඛ්‍යාව 66 ක් විය.

(iii) සමාලෝචිත වර්ෂයේ පුහුණුව සඳහා ආධුනිකයින් 27,000 ක් බඳවා ගැනීමට ඉලක්ක කළ ද බඳවාගෙන තිබුණේ 22,616 ක් වූයෙන් ආධුනික බඳවා ගැනීම් අඩුවීමට හේතු සොයාබලා ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

(iv) වෙනත් වෘත්තීය පුහුණු ආයතනවල පුහුණු ලාභීන් 35,000 ක් කාර්යස්ථ පුහුණුව සඳහා යොමු කිරීමට ඉලක්ක කළද කාර්යස්ථ පුහුණුව සඳහා යොමුකර තිබුණේ 10,040 ක් එනම් සියයට 29 ක් වූ අඩු ප්‍රමාණයකි. තවද පුහුණුලාභීන් කාර්යස්ථ පුහුණුවට යොමු කිරීමට අවස්ථාවක් ඇති ආයතන සම්බන්ධකර ගැනීමට ඉලක්ක කර තිබුණද ඒ යටතේ කිසිදු කාර්යයක් ඉටු කර නොතිබුණි.

(v) සමාලෝචිත වර්ෂය තුල දී නිලධාරීන් 150 දෙනෙකු වෘත්තීය මාර්ගෝපදේශන කාර්යයන් සඳහා පුහුණු කිරීම ඉලක්ක කළ ද ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් අධිකාරිය විසින් ගෙන නොතිබුණි.

(vi) අධිකාරියේ කටයුතු සඳහා උපදේශකයන් 50 ක් හා අනෙකුත් කාර්ය මණ්ඩලය 25 දෙනෙකු බඳවා ගැනීමට ඉලක්ක කළද එම බඳවා ගැනීම් කිසිවක් සිදු කර නොතිබුණි.

(vii) කර්මාන්ත සහායක සේවා හඳුන්වා දීම සඳහා වූ උප කාර්යයන් 5ක් වර්ෂය තුල දී ඉටුකර නොතිබුණි.

(viii) පෙර ඉගෙනුම් පසු හඳුනාගැනීමේ (RPL) ක්‍රමය සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් 30 ක් රු. මිලියන 1.25 ක් වැයකර පැවැත්වීමට ඉලක්ක කළද වැඩසටහන් 20 ක් පවත්වා නොතිබුණි.

(ix) විශේෂ පුහුණු වැඩසටහන් යටතේ ආධුනිකයන් 1,000 ක් පුහුණු කිරීම අපේක්ෂා කළ ද පුහුණු කර තිබුණේ ආධුනිකයින් 262 දෙනෙකු පමණි.

(ඇ) නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති ආධාර යටතේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පරිදි කාර්යසාධනය පහත පරිදි වේ.

(i) 2015 වර්ෂය සඳහා පෙර ඉගෙනුම් පසු හඳුනා ගැනීමේ (RPL) ක්‍රමය මඟින් සහතිකපත් 5000 ක් ප්‍රදානය කිරීමට සැලැසුම් කළද ප්‍රදානය කර තිබුණේ සහතිකපත් 532 ක් පමණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී ජාතික මධ්‍යස්ථාන 3 හි සහ දිස්ත්‍රික් මධ්‍යස්ථානවල 25 හි තත්ත්ව කළමනාකරණ පද්ධතිය (ISO Standard) ස්ථාපිත කිරීමට හා පවත්වාගෙන යාමට සැලසුම් කර තිබුණද මධ්‍යස්ථාන 2 ක පමණක් එම කටයුතු ආරම්භ කර තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

2014 ජුනි 04 වන දින රු. 4,974,144 ක් වැයකර ප්‍රධාන කාර්යාලයේ සවිකර තිබූ විදුලි සෝපානය 2015 සැප්තැම්බර් මාසයේදී අක්‍රියවී තිබුණි. නියමිත දිනදී විදුලි සෝපානය සේවා කිරීම සඳහා සේවා ගිවිසුමකට ඇතුළත්ව නොතිබීම හේතුවෙන් එය සේවා කිරීම සඳහා රු. 92,877 ක් ගෙවීමට අධිකාරියට සිදුව තිබුණි. එසේ වුවද 2015 සැප්තැම්බර් 29 දින රු. 376,623 ක් වැය කර පූර්ව කාලයද ඇතුලත් වාර්ෂික සේවා ගිවිසුමකට එළඹ තිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලයේ ආධුනිකයන් වෙත විකිණීම සඳහා ලබා දී තිබූ රු. 19,920 ක් වූ වැඩ පොත් 498 ක ඌනතාවක් නියැදි පරීක්ෂාවකදී නිරීක්ෂණය විය.

(ආ) 2014 වර්ෂයේ මාතර ප්‍රදේශයේදී රු. 35,125,261 ක් වැයකර නිපුණතා අභිෂේක වැඩසටහනක් පවත්වා එහිදී නිෂ්කාර්ය වියදම් දැරීම සම්බන්ධයෙන් නොවිසඳුන ගැටළු පැවතියදී සමාලෝචිත වර්ෂයේ දී රු. 4,574,794 ක් වැයකර ගාල්ල ප්‍රදේශයේද එවැනිම වැඩසටහනක් පවත්වා තිබූ අතර එම වැඩසටහනේ පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) පෙර ඉගැනුම පසු ඇගයුම් (RPL) වැඩසටහන මඟින් ආධුනිකයාගේ කුසලතාවයන් ප්‍රායෝගිකව ඇගයීම් කර ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටමේ සහතික ලබාදීම සිදු කරන නමුත් ගාල්ලේ පැවති මෙම වැඩසටහනේ දී ඉදිරිපත්වන ශිල්පීන්ට බෙදා දීම සඳහා විධිමත් අනුමැතියකින් තොරව රු. 1,255,950 ක් වටිනා උපකරණ කට්ටල 550 ක් මිලදීගෙන තිබුණි.

(ii) මෙම වැඩසටහන සඳහා උත්සව භාණ්ඩ, කෑම, බීම සැපයීම හා උත්සව සංවිධානය සහ පෙදරේරු ශිල්පීන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම එකිනෙකට සම්බන්ධ නොවූ කාර්යයන් වුවද මෙම කාර්යයන් සඳහා එකම කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කිරීමට අධිකාරිය කටයුතු කර තිබුණි. අවම ලංසු මිලට වඩා රු. 335,163 ක් වැඩියෙන් රු. 2,587,110 ක් වූ මිලට ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය විකුණුම් ආයතනයක් වෙත මෙම කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(iii) මෙම වැඩසටහනේ දී පෙදරේරු ශිල්පීන් 250 දෙනෙකු ඇගයීමට අපේක්ෂා කර රු.923,660 ක් වටිනා භාණ්ඩ මිලදීගෙන තිබුණ ද පැමිණ නොතිබූ ශිල්පීන් 72 දෙනෙකු වෙනුවෙන් ඉතිරිව තිබිය යුතු වූ භාණ්ඩ වල වටිනාකම මුළු භාණ්ඩ වටිනාකමට අනුපාතිකව රු. 182,180 ක ඌනතාවක් නිරීක්ෂණය විය.

(iv) වැඩසටහන අවසන් වීමෙන් පසු අමතරව සැපයුම් හා සේවා කළ බවට කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම පරිදි විධිමත් පරිදි ප්‍රසම්පාදන කමිටු අනුමැතිය රහිතව උප සභාපතිවරයාගේ අනුමැතිය මත රු. 496,250 ක් ගෙවා තිබුණි. අමතර කුඩාරම්, විජ්ගල් හා කිරි පැකට් සැපයීම සඳහා වූ එම අතිරේක වියදම්, ගිවිසුම්ගත සමාන වියදම් සහ වෙළඳපොළ මිල ගණන් සමඟ සංසන්දනාත්මකව ඉතා අධික මිල ගණන් වූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

කටුබැද්ද කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ ප්‍රදර්ශනාගාරය ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව ප්‍රසිද්ධ ලංසු කැඳවීමකින් තොරව දේදුනු පැහැති පිටු මඟින් තෝරාගත් ලංසුකරුවකු වෙත රු. 19,774,540 කට 2014 ඔක්තෝබර් 15 දින පිරිනමා තිබුණි. ගිවිසුම් අනුව 2015 මැයි මාසයේදී ප්‍රදර්ශනාගාරය ඉදිකිරීම් අවසන් කොට අධිකාරියට භාර දිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉදිකිරීම් අවසන්කර අධිකාරිය වෙත බාර දී නොතිබුණි.

4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හෙද සහායක පාඨමාලාව ආරම්භ කිරීම සඳහා 2011 හා 2012 වර්ෂවල පුහුණු මධ්‍යස්ථාන 10 ක් වෙත ලබා දී තිබූ වටිනාකම රු. 2,398,571 ක් වූ භාණ්ඩ එම පාඨමාලාව ආරම්භ නොකිරීම නිසා අදාල මධ්‍යස්ථානවල නිෂ්කාර්යව පැවතුණි.

(ආ) 2012 වර්ෂයේ දී ප්‍රාදේශීය ලේකම්වරයෙකු විසින් කල්මුණේ දිස්ත්‍රික් කාර්යාලය වෙත ලබාදී තිබූ අක්කරයක් වූ ඉඩම 2016 සැප්තැම්බර් 30 වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) 2014 වර්ෂයේ කුරුණෑගල දී පවත්වන ලද නිපුණතා අභිෂේක වැඩසටහන සඳහා මිලදී ගෙන තිබූ රු.1,464,848 ක් වූ පුහුණු උපකරණ පැවතියදී එම උපකරණ භාවිතා නොකර මාතර පැවති එවැනිම වැඩසටහනක් සඳහා උපකරණ තොගයක් මිලදී ගෙන තිබුණු අතර ඒවා භාවිතා නොකර ඔරුගොඩවත්ත ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි.

4.6 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයි එස් ඕ (ISO) තත්ත්ව පාලන කටයුතු සඳහා විවිධ වර්ණයන්ගෙන් යුතු ප්ලාස්ටික් ලිපිගොනු කවර 8,655 ක් මිලදී ගැනීම සඳහා අවශ්‍ය භාණ්ඩවල පිරිවිතර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් කලින් තීරණය කර නොතිබියදී අවම මිල ඉදිරිපත් කළ සැපයුම්කරුගේ භාණ්ඩ අවශ්‍ය පිරිවිතරවලට අනුකූල නොවන බව දක්වමින් අවම මිලට වඩා රු. 771,131 ක් වැඩියෙන් මිල ඉදිරිපත් කළ සැපයුම්කරුවකු තෝරාගෙන රු. 3,793,434 ක ගිවිසුමකට එළඹ තිබුණි.

2016 ඔක්තෝබර් මාසය වන විට මෙම ලිපිගොනු කවරවලින් රු. 2,955,644 ක් වටිනා ලිපිගොනු කවර 5781 ක් අවශ්‍යතාවයන්ට නොගැලපීම හා වෙනත් හේතු මත භාවිතා කර නොතිබුණු අතර ඒවා ආරක්ෂිත ලෙස ගබඩා කර ද නොතිබුණි.

4.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් අධිකාරියේ සම්පත්

අධිකාරියේ සේවකයන් දෙදෙනෙකු රේඛීය අමාත්‍යාංශයට හා තවත් සේවකයන් 07 දෙනෙකු අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත මාස 03 ක කාල පරිච්ඡේදයක් සඳහා ද, එක් අයෙකු 2015 දෙසැම්බර් 09 දින සිට විගණන දිනය වූ 2016 ඔක්තෝබර් 25 දක්වාද මුදාහැර තිබුණි.

4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලය 1358 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 869 ක් වීමෙන් පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 490 ක් වූ අතර එම තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. පුරප්පාඩු තනතුරුවලින් කථිකාචාර්ය, පුහුණු නිලධාරී, උපදේශක හා පරීක්ෂක යන අනුමත අධ්‍යයන තනතුරු 784 න් තනතුරු 353 ක් එනම් සියයට 45 ක් පුරප්පාඩු වී තිබීම ආයතනයේ පුහුණු හා පරීක්ෂණ කටයුතු කෙරෙහි අහිතකර බලපෑමක් සිදුවන බව නිරීක්ෂණය විය.

(ආ) 2011 වර්ෂයේ සිට අධිකාරියේ ඉදිකිරීම් හා නඩත්තු අංශයේ සහ 2009 වර්ෂයේ සිට වාහන නඩත්තු කටයුතු සඳහා රාජකාරී පැවරුම් පදනම මත නිළධාරීන් දෙදෙනෙකු බඳවාගෙන විගණිත දිනය වූ 2016 ඔක්තෝබර් 25 දක්වාම සේවයේ යොදවා තිබූ නමුත් එම කාර්යයන් සඳහා අධිකාරියට සෘජුව වගකියන ස්ථිර නිළධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කටුබැද්ද ආධුනිකත්ව අභ්‍යාස ආයතනයට අයත් අංක 5/B1/01 දරන නිල නිවස බාහිර පාර්ශවයකට කුලී පදනම මත ලබාදීම මගින් රාජ්‍ය සම්පත් අයථා ලෙස පරිහරණය කිරීමට ඉඩහැරීම යන චෝදනාව මත වැඩ තහනම් කරන ලද ගණකාධිකාරීවරයකු සම්බන්ධයෙන් කරන ලද මූලික පරීක්ෂණ වාර්තාව අස්ථානගතව තිබූ අතර 2015 ජනවාරි 19 දින සිට එම නිලධාරියා නැවත සේවයේ පිහිටුවා තිබුණි. නැවත නව මූලික පරීක්ෂණයක් පැවැත්වෙමින් තිබියදී එම නිලධාරියා වෙත කොළඹ විශ්වවිද්‍යාලය මගින් පවත්වන පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා රු. 122,500 ක් අධිකාරිය මගින් ලබාදී තිබුණි.

(ඈ) නියමිත පරිදි ඉදිරි වැඩසටහන් සහ නිවාඩු අනුමත කර නොගැනීම නිසා දිස්ත්‍රික් භාර නිලධාරියකුගේ 2013, 2014 හා 2015 වර්ෂ සඳහා වූ වැටුප් රහිත නිවාඩු දින පිළිවෙලින් 173 ක් 191.5 ක් හා 05 ක් ලෙස දින 369.5 ක් වී තිබූ අතර ඒ සඳහා ගෙවන ලද වැටුප් ගණනය කර 2016 ඔක්තෝබර් වන විටත් අයකර නොතිබුණි.

4.9 වාහන උපයෝජනය

අධිකාරියේ වාහන නඩත්තුව සහ පාලනය සම්බන්ධ විධිමත් ක්‍රමවේදයක් නොතිබූ අතර ඒ සම්බන්ධ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ දී ජර්මානු ජාත්‍යන්තර ආධාර (ජී අයි ඉසෙඩ්) සංවිධානයෙන් ලැබී ධාවන තත්ත්වයේ තිබූ වාහනයක එන්ජිම වෙනත් වාහනයකට සවිකර තිබූ අතර ඒ සඳහා රු. 185,000 ක් වැයකර තිබුණි. එහෙත් දින 35 කට පසු එම වාහනයේ කොටසක් (ක්ලච්) ක්‍රියා විරහිත වීම නිසා එය භාවිතයෙන් ඉවත් කර 2016 වර්ෂයේ දී අපහරණය කර තිබීමෙන් වැය කරන ලද රු. 185,000 ක් නිෂ්ඵල වියදමක් විය.

(ආ) 2007 වර්ෂයේ සිට ධාවනය කර නොතිබූ වාහනයක් 2012 සැප්තැම්බර් මාසයේ දී රු. 194,950 ක් ගෙවා පින්තාරු කිරීම ඇතුළු අළුත්වැඩියා සහ පසුව වරින් වර රු. 145,976 ක් දක්වා වූ අළුත්වැඩියා සිදුකර තිබුණි. එහෙත් ධාවන සටහන් අනුව අළුත්වැඩියාවෙන් පසු කිලෝමීටර් 102 ක් පමණක් ධාවනය කර මෙම වාහනය අපහරණය කර තිබුණි.

(ඇ) 2007 සිට 2014 වර්ෂය දක්වා එන්ජිමේ අලුත්වැඩියාවක් සඳහා යොමු කර තිබූ වාහනයක් 2014 වර්ෂයේදී රු. 1,683,500 ක් ගෙවා අළුත්වැඩියා කර තිබුණි. 2011 දී අළුත්වැඩියාව සඳහා වූ ඇස්තමේන්තුව රු. 918,428 ක් වූ අතර 2014 දී අළුත්වැඩියාව සඳහා රු. 765,072 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

අධිකාරියට අයත් ඔරුගොඩවත්තේ පිහිටි මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ සහාය, වාහන අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් ලබාගත හැකිව තිබිය දී සහ කාර්ය පැවැරුම් මත වාහන නඩත්තු කටයුතු සඳහා නිලධාරියෙකු 2009 සිට සේවයේ යොදවාගෙන තිබියදී මෙම අඩුපාඩු සිදුවී තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

අධිකාරිය විසින් සකස්කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට අනුකූලවන පරිදි කාර්යසාධන වාර්තාව සකස්කර නොතිබූ අතර පිළියෙළ කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි මූල්‍ය ප්‍රගතිය ඇතුළත්කර නොතිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

2009 ජුනි 09 දිනැති අංක ඩී. එම්එ/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 133 හි සඳහන් පරිදි අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නිලධාරීන් 08 දෙනෙකු අනුයුක්ත කර තිබූ නමුත් විගණන සැලැස්මට අනුකූලව විගණනයන් ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කටයුතු හා පෙන්වා දී තිබූ කරුණු නිවැරදි කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු නොකිරීම නිසා එම ඒකකය පවත්වාගෙන යාමෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

5.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 10 සිට සියයට 369 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි.

5.4 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ දී ලෝක තරුණ සමුළුව සඳහා අමාත්‍යාංශය වෙනුවෙන් අධිකාරිය වැය කළ රු. 2,000,000 ක මුදල ලැබිය යුතු ශේෂ යටතේ දක්වා නොතිබුණි.

(ආ) විනය පරීක්ෂණයකින් අනතුරුව සේවයෙන් පහ කරනු ලැබූ නැතහොත් සේවය අවසන් කරනු ලැබුවා වූ සේවකයෙකු රාජ්‍ය සේවයේ පත්වීමක් ලැබීමට නුසුදුසු වන නමුත් මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන් චෝදනා ලැබ 2013 මැයි 08 දින වැඩ තහනමට ලක්වූ වෙනත් ආයතනයක නිලධාරියෙකු අධිකාරියේ අධ්‍යක්ෂ (මුදල්) තනතුරට බඳවා ගෙන තිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර		නිරීක්ෂණ
(අ)	ගබඩා පාලනය	(i) සියළු ගබඩා ද්‍රව්‍ය මිලදී ගැනීම් පොත්වලට ඇතුලත් නොකිරීම.
		(ii) නිපුණතා අභිෂේක වැඩසටහන් සඳහා කරන ලද ගබඩා ද්‍රව්‍ය මිලදී ගැනීම් පිළිබඳ ගබඩාකරුවන් මඟින් තහවුරු කර නොගැනීම.
(ආ)	වාහන උපයෝජනය	(i) අවශ්‍ය අවස්ථාවලදී වාහන අළුත් වැඩියාවට යොමු නොකිරීම නිසා වාහන අබලන් තත්ත්වයට පත් වීම.
		(ii) සුදුසුකම්ලත් නිලධාරින්ගේ පරීක්ෂාවකින් හා ඇස්තමේන්තුවලින් තොරව වාහන අළුත් වැඩියා සඳහා යොමුකිරීම නිසා නිෂ්කාර්ය වියදම් දැරීමට සිදුවීම.
(ඇ)	කාර්ය මණ්ඩල පරිපාලනය	(i) අධ්‍යයන කාර්ය මණ්ඩල ප්‍රමාණවත් පරිදි බඳවා නොගැනීම නිසා පුහුණු කටයුතු සඳහා බාධා පැමිණීම.
		(ii) රහස්‍යතාවය සහ ආරක්ෂාව සැපයෙන පරිදි පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම, විනය පරීක්ෂණ පැවැත්වීම හා එම තීරණ ක්‍රියාත්මක නොකිරීම.
(ඈ)	මූල්‍ය කළමනාකරණය	විධිමත් අනුමැතියකින් තොරව අරමුදල් පැවත්වාගෙන යාමට ඉඩහැරීම නිසා මුදල් නිෂ්කාර්යව පැවතීම.
(ඉ)	පොත්පත් හා ලේඛන පවත්වාගැනීම.	කටුබැද්ද ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ විදුලි කාර්මික අංශයේ භාණ්ඩ 800 ක් බඩුවට්ටෝරු පොත්වල ඇතුලත් නොකිරීම.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්ති ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ කොටුමිපතට පිළිතුරු

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම් කරන අඩුපාඩු

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පසුගිය වසරවල සිදුකල ආකාරයට සකස් කර ඇත.

(අ) මනිපායි පුහුණු මධ්‍යස්ථානය සඳහා 2016.05.09 දින ගිවිසුම අත්සන් කර මැයි මාසයේදී අදාල ගෙවීම් කර ඇත. අවසාන ගිණුම් පිළියෙල කරන විට මෙයට අදාල ලියකියවිලි මුදල් අංශයට ලැබී නොමැති බැවින් අවසාන ගිණුම්වල පෙන්වා නොමැත.

(ආ) වවුචරය බාහිර විගණන අංශයට යවා ඇත. ව.අ.216/15/Cap/3015 - 31/12/2015 ඇමුණුම 01. 99 අවුරුදු බදු නිසා මෙය ප්‍රාග්ධනිත කර ඇත.

(ඇ) බාහිර ආයතන වලට මුදා හල සේවකයින්ට ගෙවන ලද නමුත් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබූ ලැබිය යුතු වැටුප් ශේෂ 2014 සඳහා 283,163.40ක් හා 2015 වෙනුවෙන් රු.650,181.56ක් ලැබිය යුතු ශේෂ යටතේ වාර්ෂික ගිණුම්

ලේඛණ 5(5)හි පිටු අංක 23 යටතේ පෙන්වා ඇත. තවද එම විෂයය ප්‍රතිපූර්ණය කර යැවීම සඳහා වූ ලිපිද අදාල ආයතන වෙත යවා ඇති බව වැඩිදුරටත් දැනුම් දෙමි. ඇමුණුම අංක 02

(ඈ) උතුරු නැගෙනහිර පළාත්හි පැවති සම්මන්ත්‍රණ වෙනුවෙන් සහභාගී වූ නිලධාරීන් සඳහා ඉදුම් හිටුම් (Accomodation) පමණක් 2015 දි පුහුණු විෂයමි යටතේ වැය ශීර්ෂයක් නොමැති බැවින් විවිධ විෂයමි යටතේ පෙන්වා ඇති අතර 2016 වර්ෂයේදී මෙම විෂයය පුහුණු විෂයමි යටතේ වූ වැය ශීර්ෂයට හරකර ඇති බව වැඩිදුරටත් පෙන්වා දෙමි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී පමණක් නොව සෑම වර්ෂයකදීම ක්‍රමක්ෂය ලෙස බදු සඳහා වූ ඉඩම් සඳහා ඒ බසු අවුරුදු ගණන ගණනය කරනු ලබයි. ඇමුණුම අංක 04 ගිණුම් වලට අදාලව කර ඇති රු.452,458 ඉඩම සඳහා ක්‍රමාක්ෂය ප්‍රමාණය වේ.

2.2.2 නොසැසඳුණු ගිණුම්

අන් මුදල්වල ඇති ශේෂයන්ගේ වෙනස්කම් සඳහා පාලක මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර එම අනුමැතිය අනුව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

	විෂයය	වටිනාකම රු.	
i	දේපල පිරියත හා උපකරණ	902,143,338(ධාරණ අගය)	ස්ථාවර වත්කම් ලේඛණය පිලියෙල කර මුදල් අංශයේ ඇත.
ii	දේපල පිරියත හා උපකරණ වාර්ෂික මිලදී ගැනීම්	66,310,302	විස්තරාත්මක උප ලේඛණ (සටහන් අංක 02) විගණනයට ඉදිරිපත් කර ඇති අතර එම සටහනේ අදාල අංක අනුව වර්ගීකරණය කර එම වර්ෂයට අදාල නව මිලදී ගැනීම් (Additions during the year 2015) යටතේ හාණ්ඩ විස්තරය, ප්‍රමාණය මිලදී ගත් දිනය පිරිවැය සටහන් කර ඇත.
iii	වාර්ෂික ක්ෂය	143,822,779	වාර්ෂික ක්ෂය වෙන් කිරීමද ඉහත අංක (ii) යටතේ දක්වා ඇති පරිදි එම වර්ගීකරණයටම අනුව විස්තරාත්මකව දක්වා ඇත.
iv	ක්ෂය ගැලපීම්	1,298,321	ඉහත අංක (ii) හි සඳහන් සටහන් අංක (2) උපලේඛණයේ විස්තර අඩංගු වේ.
v	දේපල පිරියත හා උපකරණ ගැලපීම්	388,781	ඉහත අංක (ii) හි සඳහන් සටහන් අංක (2) උපලේඛණයේ විස්තර අඩංගු වේ.
vi	දේපල පිරියත හා උපකරණ ගැලපීම් ඉවත් කිරීම්	11,219	ඉහත අංක (ii) හි සඳහන් සටහන් අංක (2) උපලේඛණයේ විස්තර අඩංගු වන අතර ඊට අමතරව පිළියෙල කරන ලද ලේඛණයක්ද මුදල් අංශයේ ඇත.

2.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) සමාලෝචිත වර්ෂයේදී ණයගැති ශේෂය රු.56,146,515.48 කි. 2016.11.20 දිනට ණයගැති ශේෂය පහත අයුරින් වේ.

වර්ෂ පහකට පෙරවූ ශේෂය - 2,135,373.58
වර්ෂ 3 සිට 5 දක්වා ශේෂය - 2,302,122.86
වර්ෂ 1 සිට 2 දක්වා ශේෂය - 31,878,388.62
එකතුව - 36,315,885.06

එයින් 2014 SSDP ව්‍යාපෘතියෙන් 2014 වර්ෂය වෙනුවෙන් අඩුකළ ප්‍රතිපූර්ණය නොවූ මුදල රු. 29,980,878.98 කි. ඉන් ඉවත්වූ පසු දැනට නිරවුල් නොවූ ණයගැති ශේෂය වනුයේ රු.6,335,006.08ක් බව දන්වනු කැමැත්තෙමි.

(ආ) 2015 දෙසැම්බර් වන විට ඉතිරිව තිබූ ණයගැති ශේෂ රු.56,146,515/-න් 2016 ඔක්තෝබර් වන විට රු.14,049,965/-නිරවුල් වී රු.42,096,550/-ක් පමණක් ඉතිරිව ඇත.

(ඇ) සේවය අතහැර ගිය නිලධාරීන්ගේ නීතිමය තටයුතු අවසන් නොවීම මෙයට හේතුවී ඇත.(2014 පෙර විගණනයේදී අළුත්වී ඇත.)

(ඈ) සමාලෝචිත වර්ෂයේදී ණය හිමි ශේෂය රු.13,136,958.21 ක් වන අතර 2016.11.20 දිනට ණයහිමි ශේෂය පහත අයුරින් දැක්විය හැක.

වර්ෂ පහ ඉක්මවූ ශේෂ - 89,688.00
වර්ෂ 3ත් 5 ත් අතර ශේෂ - 4,883,124.86
වර්ෂ 1 ත් 2 ත් අතර ශේෂ - 383,245.38
නිරවුල් නොවූ ශේෂ - 5,356,058.24

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල නිරවුල් නොවූ අභ්‍යන්තර ණයගැති ශේෂය රු.1,971,776.13ක් වේ. තවද වසර 05

ක් ඉක්මවූ ණය හිමි ශේෂය රු.89,688.00කි.

(ඊ) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ නිරීක්ෂණ හා මමද එකහවෙමි.

2.4 **නීති රීති රෙගුලාසි සහ කළමණාකරන තීරණවලට අනුකූල නොවීම**

(අ) මුදල් ආයෝජනයකිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ එකඟත්වය ලබා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.
(ආ)

(i),(ii),(iii) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ නිරීක්ෂණ හා මමද එකහවෙමි.

(iv) නිටපු සභාපතිගේ හා අධ්‍යක්ෂ ජනරාල්වරයගේ උපදෙස් පරිදි මෙය ආයතනික වේලාවෙන් පසුව ආයතනයේ

දැනුමෙන් හා පුහුණුවීම් වලින් තොරව සිදු කරන බැවින් 10% ක මුදල අඩු නොකිරීමට අධ්‍යක්ෂ ජනරාල් හා සභාපතිවරයා විසින් අනුමැතිය ලබාදී ඇත. (ඇමුණුම 03)

(v) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ නිරීක්ෂණ හා මමද එකහවෙමි.

(ඇ) (i),(ii) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ නිරීක්ෂණ හා මමද එකහවෙමි.

(iii) පසුගිය කාලයේ සේවක ඌනතාවක් තිබූ අතර නව බඳවාගැනීම් හේතුවෙන් මෙම තත්ත්වය නැවත ඇති නොවන ලෙස කටයුතු යොදා ඇත.

(iv),(v) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ නිරීක්ෂණ හා මමද එකහවෙමි.

(ඈ),(ඉ),(ඊ) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ නිරීක්ෂණ හා මමද එකහවෙමි.

(උ) අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත මෙය සිදුකර ඇති අතර ඒ අනුව මුදල් අංශය ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. (ඇමුණුම 04)

(උ) (i), (ii)
ජාතික ආයතන හා ප්‍රධාන කාර්යාලයේ තැන්පතු සම්බන්ධයෙන් සම්ස්තර වාර්තාවක් සකස් කරමින් පවතින අතර ඉදිරියේදී මහා භාණ්ඩාගාරයේ උපදෙස් මත කටයුතු කරනු ඇත. මේ සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.

3.

3.1 (අ), (ආ) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ නිරීක්ෂණ හා මමද එකහවෙමි.

3.2 (අ), (ආ) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ නිරීක්ෂණ හා මමද එකහවෙමි.

4.

4.1 (අ) (i), (ii) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ නිරීක්ෂණ හා මමද එකහවෙමි.

(ඇ) <u>2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටුකර නොතිබූ හා ප්‍රමාණවත් තරම් ඉටු නොකළ බව පැවසෙන කාර්යයන්</u>

(i), (ii), (iii), (iv), (v), (vi) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ නිරීක්ෂණ හා මමද එකහවෙමි.

(vii) ව්‍යාපාරික සැළසුම් 08ක් සැළසුම් කළද 2015 වසරේ ක්‍රියාත්මක කිරීමට තිබූ පුහුණු මධ්‍යස්ථාන සම්බන්ධ ව්‍යාපාරික සැළසුම් ආරම්භ කර නොතිබූ බැවින් නව සැළසුම් වෙනුවට 2016 වසර සඳහා 2015 වසරේ ආරම්භ නොකළ සැළසුම් ක්‍රියාත්මක කරන ලෙස SSD ව්‍යාපෘතිය මඟින් උපදෙස් ලබා දෙන ලදී.

(viii), (ix), (x), (xi), (xii) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ නිරීක්ෂණ හා මමද එකහවෙමි.

(ඈ) (i), (ii), (iii) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ නිරීක්ෂණ හා මමද එකහවෙමි.

4.2 **කලමණාකරන ක්‍රියාකාරකම්**

(අ) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ නිරීක්ෂණ හා මමද එකහවෙමි.

(ආ) 2016 නොවැම්බර් මස සිට එම තිලධාරීන්ට වැටුප් මුදල් ලබාගැනීම සඳහා බැංකු ගිණුම් අංක මුදල් අංශයට ලබාදෙන ලෙස නැවත දැනුම් දීම් කරනු ඇත.

(ඇ), (ඈ), (ඉ) (i), (ii), (iii), (iv), (ඒ), (ඓ) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ නිරීක්ෂණ හා මමද එකහවෙමි.

4.3 <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්</u>

(අ), (ආ) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ නිරීක්ෂණ හා මමද එකහවෙමි.

(ඇ) (i) ඉදිකිරීම් ශිල්පීන් 250ක් සඳහා ඇගයීම් කරුවන් 25ක් ක් පමණද රූපලාවන්‍ය ශිල්පීන් සඳහා ඇගයීම්කරුවන් 19ක ප්‍රමාණයක්ද කැඳවීමට සිදුවිය. අදාල දිස්ත්‍රික්කය තුලින් මෙපමණ ප්‍රමාණයක් ගත නොහැකි නිසා දුර බැහැරින්ද ඇගයීම්කරුවන් පැමිණීම නිසා නවාතැන් පහසුකම් සැපයීමට සිදුවිය. හෝටල් වෙන් කිරීම ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය මඟින් සිදුකර ඇති අතර ඉදිරියේදී මෙවැනි වැඩසටහන් පැවැත්වීමේදී නාම ලේඛණ ලබාගැනීමට අදාල අංශවලට උපදෙස් දෙන ලදී.

(ii) මේ සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කර ඇත. එහි නිර්දේශයන් මත ඉදිරි ක්‍රියා මාර්ග ගනු ඇත.

(iii) සම්පූර්ණ අයිතමවලට මිල ගණන් ඉදිරිපත් කර ඇති මුළු වැඩසටහන සඳහාම වූ අවම මිල ඉදිරිපත් කල ලංසුකරුට අදාල කාර්ය ලබාදීමට තාක්ෂණික කමිටුව නිර්දෙශ කර ඇත.

(iv) ඉදිරියේදී මෙවැනි උත්සව සංවිධානය කිරීමේදී භාණ්ඩ ලැබීම්, පරිභෝජනය පිළිබඳ විස්තර සඳහා ස්වාධීන
තිලධාරියෙකු පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර RPL වැඩසටහන සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් ක්‍රියාත්මක වෙමින් පවති.

එසේම 8X8 ටයිල් කැට ඇණවුම් කර ලබාගෙන ඇත. (ඇමුණුම 05)

(v) මේ සම්බන්ධයෙන් මූලික විමර්ශණයක් ක්‍රියාත්මක වෙමින් පවති. (ඇමුණුම 06- A, B, C)

4.4

(අ) (i), (ii), (iii අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ නිරීක්ෂණ හා මමද එකහවෙමි.

4.5 (අ) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ නිරීක්ෂණ හා මමද එකහවෙමි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 2.14.1 ට අදාල 2014.07.14 දිනැති අංක (28) සංශෝධනය මඟින් ආයතන ප්‍රධානියාට හිමි භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ සීමාව රු.250,000 සිට රු.500,000 දක්වා
වැඩිකර ඇත. පිටපත මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම 06 A, B)

(ඇ) ඇණවුම් කරන ලද පරිගණක ප්‍රධාන කාර්යාලයේ විවිධ අංශයන්ට සහ දිස්ත්‍රික් කාර්යාලයන්ට බෙදා හැර ඇත. ඒ අනුව භාණ්ඩ ලැබීම් පත්‍ර 7කින් භාණ්ඩ බාරගැනීම සිදු කර ඇත.

4.7 (අ), (ආ), (ඇ) (i), (ii), (iii), (v), (ඉ) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ තිරික්ෂණ හා මමද එකඟවෙමි.

4.8 අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ තිරික්ෂණ හා මමද එකඟවෙමි.

4.9 අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ තිරික්ෂණ හා මමද එකඟවෙමි.

4.10 (අ), (අ) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ තිරික්ෂණ හා මමද එකඟවෙමි.

4.11 අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ තිරික්ෂණ හා මමද එකඟවෙමි.

4.12 (අ), (ආ), (ඇ), (ඈ), (ඒ), (ඌ) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ තිරික්ෂණ හා මමද එකඟවෙමි.

(ඉ) 2015 වර්ෂය තුල මෙවැනි ගණුදෙනුවක් සිදුවී නොමැත.

(උ) දිස්ත්‍රික් නිලධාරීන්ගේ 2013,2014 සහ 2015 වර්ෂ සඳහා අඩුකළයුතු වැටුප් රහිත තිවාඩු මුදල රු.433,856.45 කි.
ඔහුගේ වැටුප අනුව මාසයකට අඩුකළ හැකි උපරිම මුදල රු.36,600/- වන අතර මාගේ අනුමැතියෙන් අනුව 2016 ඔක්තෝබර් මස සිට රු.36,000/- බැගින් අඩුකිරීම් කටයුතු සිදු කරයි.

4.13 (i), (ii), (iii), (iv), (v) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ තිරික්ෂණ හා මමද එකඟවෙමි.

5. ගිණුම් කටයුතු හා යහපාලනය

5.1 කාර්ය සාධන වාර්තාව රේඛීය අමාත්‍යාංශය විසින් සපයනු ලැබූ ආකෘති පත්‍රයට අනුකූලව සියඵම කරුණු අන්තර්ගත කර යවා ඇත. මූල්‍ය වෙන් කිරීම් ක්‍රියාකාරී සැලැස්මේ අඩංගු කර ඇති අතර මූල්‍ය ප්‍රගතිය දැක්විය
හැක්කේ අදාල යෝජනා ක්‍රියාත්මක කිරීමෙන් පසුවය.

5.2 අභ්‍යන්තර විගණන අංශය මඟින් ඉදිරිපත් කරන විමසුම් සම්බන්ධයෙන් අවධානය යොමුකර යෝජිත ක්‍රියාමාර්ග සහ
නිවැරදි කිරීම් පිළිබඳව කටයුතු කිරීමටත්, පසුවිපරම් කිරීමටත් සටහන් කර ගන්නා ලදී.

5.3 අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ තිරික්ෂණ හා මමද එකඟවෙමි.

5.4 නොවිසඳී ඇති විගණන ඡේද

(අ) ලෝක තරුණ සමුළුව වෙනුවෙන් වියදම් කර අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල ලැබීම සම්බන්ධයෙන් ස්ථිර නිගමනයකට පැමිණීම නොහැකිවීම සහ අමාත්‍යාංශ මාරුවීම යන හේතු මත ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සිදු නොකරන ලද බව 2014 14-2(සී) විගණන වාර්තාවට ද පිළිතුරු දී තිබුණි. (ඇමුණුම අංක 07)

(ආ) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ තිරික්ෂණ හා මමද එකඟවෙමි.

6. (අ) ඉදිරියේදී මේ සම්බන්ධයෙන් මෙවැනි අතපසුවීම් සිදු නොකිරීමට අදාල අංශ දැනුවත් කල අතර එසේ නොකරන ලද මාතර RPL වැඩසටහන සඳහා මිලදී ගත් භාන්ඩ ඉන්වෙන්ට්‍රි කරන ලදී. එසේම සියඵම මිලදී ගැනීම් ගබඩාව හරහා සිදු කර ලේඛණ ගත කිරීමට පියවර ගෙන ඇත.

(ආ), (ඇ) අදාල අංශවලින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔබගේ තිරික්ෂණ හා මමද එකඟවෙමි.

(ඇ) මහා භාණ්ඩාගාරයේ අනුමැතියට යටත්ව ඉදිරියේදී පවත්වාගෙන යන අරමුදල් වලින් උපරිම ප්‍රයෝජනයක් ගැනීමට කටයුතු කරනු ලැබේ.